# 2013 – 12 – 03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

## (01)

### 01:01 2013 – 11 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 11 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 – 11 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## (03 ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

3.1 " නව ආගමික ස්ථාන ඉදි කිරීම " මැයෙන් 2013 -10 - 08 දාතමින් බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ආගමික ස්ථාන ලෙස සැළකෙන පන්සල්, පල්ලි කෝවිල්, දේවාල, දහම් පාසල්, භාවනා මධ්‍යස්ථාන, යාඥා මධ්‍යස්ථාන හා බෝධි, ප්‍රතිමා, ධර්මචක්‍ර, සුරුවම්, කුරුස සහ වෙනත් ආගමික සංකේත, දහම් පාසල්, භාවනා මධ්‍යස්ථාන හා යාඥා මධ්‍යස්ථාන අලුතෙන් ඉදිකොට පවත්වාගෙන යෑමට පෙරත් ආගමික සංකේත ඉදිකිරීම හෝ පවත්වාගෙන යෑමට පෙරත් ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2008- 10- 18 දිනැති ලිපියේ පළමුවැනි ජේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු බැව් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **නව ආගමික ස්ථාන ඉදිකිරීමේදී ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2008- 10- 18 දිනැති ලිපියේ පළමුවැනි ජේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.2 " පාබල මේලා සැණකෙළිය සඳහා බැනර්/ කටවුට් සහ ප්‍රචාරක කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම මැයෙන් " බුස්ස යුද හමුදා කඳවුරෙහි ප්‍රධාන උපදේශක මේජර්වරයා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ මියගිය හා ආබාධිත රණවිරුවන් වෙනුවෙන් රෙපිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකරමින් පවතින ස්මාරකය හා ආබාධිත රණවිරුවන්ගේ නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් රැස්කර ගැනීම පිණිස "පාබල මේලා" නමින් සැණකෙළියක් හා වෙළඳ ප්‍රදර්ශනයක් 2013 දෙසැම්බර් මස 19, 20, 21, 22 සහ 23 යන දිනයන්හි හික්කඩුව මහජන ක්‍රීඩා පිට්යේදී පැවැත්වෙන බවත් එහි බැනර් හා කටවුට් සීමිත ප්‍රමාණයක් නගර සභා බල ප්‍රදේශය ප්‍රසිද්ධ ස්ථාන කිහිපයක මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බැනර් හා කටවුට් නගර සභා බල ප්‍රදේශයේ මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3.3 " පළාත් පාලන ආයතන සඳහා දත්ත පද්ධතියක් හඳුන්වාදීම " මැයෙන් දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

නව තාක්ෂණය හා අනුගත වෙමින් පළාත් පාලන ආයතන සඳහා ජාලගත මෘදුකාංගයක් හඳුන්වා දීමට අදහස් කරන බවත් එමගින් විවිධ ආයතනයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි වන බවත් ඒවගේම පළාත් පාලන ආයතනයන්ට අවශ්‍ය තොරතුරු ද කඩිනමින් යැවීමට හැකිවන බවත් මෙම පද්ධතිය වෙබ් අඩවියක් ලෙසද පවත්වාගෙන යා හැකි බවත් ඒ සම්බන්ධයෙන් වන වියදම් ඇස්තමේන්තුව රු. 45500.00 ක් වන බවත් දන්වා තිබුණි.

**තීරණය**

☞ **රු. 45500.00 ක් වන මුදල ගෙවා පළාත් පාලන ආයතන සඳහා වූ දත්ත පද්ධතිය ලබා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3.4 " කුසලතා තරග විභාග ප්‍රතිඵල මත දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම- 2012(2013) " මැයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියට උසස් කිරීම සඳහා 2013 වර්ෂයේ පවත්වන ලද කුසලතා තරග විභාග ප්‍රතිඵල මත 2013-03-30 දින සිට දකුණු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවයේ අධි පන්තියට උසස් කරන ලද බවත් වහාම ක්‍රියාත්මක වන පරිදි අම්බලන්ගොඩ නගර සභාවේ වැඩ බලන ලේකම් තනතුරට පත් කරන ලද බවත් දන්වා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම මේකට විරුද්ධව කතා කරනව නෙමෙයි. ලේකම් කෙනෙක් පත් වෙලා ආවනම් එතුමා ලේකම් වරයා තමයි. සභාවට යොමු කිරීමක් අවශ්‍ය නැහැ. චෙක්පත් අත්සන් කිරීමට විතරක් සභාවෙන් බලය දෙනවා. මේක අලුත් සම්ප්‍රදායක්. චෙක්පත් අත්සන් කිරීමට බලය දීමට අපි සභාව එකග වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගර සභා ආඥා පනතේ 27 (1) හි තිබෙන විදියට සභාවට යොමු කරන්න ඕනෙ.

**තීරණය**

☞ **අම්බලන්ගොඩ නගර සභාවේ වැඩ බලන ලේකම්වරයා වශයෙන් භාරත සමරසේකර මහතා පත් කිරීම පිළිගැනීමට සුදුසු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

☞ **පෙ ව 9.55 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා සභාවට පැමිණෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** **යථා පරිදි කල්දී ඇති යෝජනා**

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා** **නැත**

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**05:02:01** ප්‍රාදේශිය මහ ලේකම්ගේ අංක ABM/LD/I/A9/47 හා 2013.10.30 දිනැති ලිපිය සමග THW නිවාස ලාභීන් සදහා ඔප්පු ලබාදිමට මු.පි.ගා 3780 සිතියම හා ඊට අදල කට්ටි නාම ලේඛනය එවා ඇත. ඒ අනුව ප්‍රාදේශිය ලේකම් විසින් ලබාදි ඇති පහත නම් සඳහන් අයට ඔප්පු ලබා දිමට යෝජනා කර සිටිමි.

01. මුතුකුමාර ධනසිරි
02 .සොපිනෝනා වන්නිපුර
03. බිංදුගේ නේවිල් නන්දන
04. තුඩාවිදානගේ චන්ද්‍රලාල්
05. පසික්කු හැන්දිගේ ගුණපාල
06. වඩුගේ පද්මා අයිරාංගනි
07. ගුරුක්‍රිස්තෝම්බ මැක්සි චමින්ද සිල්වා
08. කුඩා විදාන පියසිරි
09. රාජපක්ෂමනික්කුනම්බි වර්ණසිරි
10. දොන් නිමන් පටබැදි විජේපාල
11. කන්ද උඩගේ රංජිත්
12. වීරද්දන රවින්ද වනතුංග
13. ගරුමුනි හේමවති
14. දොඹගේ සරත්
15. මංත්‍රි විදාන ලෝයිටර්
16. කුඩා විදාන කරුණාසිරි
17. දිසානායක පද්මසිරි
18. අන්දවාස් පටබැදිවාස් ගුනවර්ධන මදුරාවති
19. නානායක්කාර ඩොට්ල්
20. නයිප්පුපාවඩු දිලිප්
21. හේවාරාලලාගේ සේනගේ ප්‍රියන්ත
22. ඉගල හේවා නිහාල් නන්දන
23. මනිමෙල්වඩු තිලකාවති
24. ලාල් නන්දන ද සිල්වා
25. කුලප්පුවාවඩු ගුණසිරි
26. රාජපක්ෂ මනික්කුනම්බි පියසිරි
27. මුරුක්කුවාදුර සෝමවති මෙන්ඩිස්
28. වල්ගමගේ ප්‍රියන්ත කුමාර
29. මාදුවගේ නිහාල්
30. අන්තිඝද මරක්කල සුමිත් ජනිත
31 විරක්කොඩි ආරච්චි අයේෂා ලක්මිණි
32. ද්දෙහිංග සෝමසිරි
33. දවල දාඹුරේ ගමගේ තිලකසිරි
34. මනේන්ද්‍ර ගම්හේවා ප්‍රසන්න සංජිව
35. කෝට්ටගේ සරත්
36. කලුගල හේවා ආරියරත්න
37. මුරුක්කුවාදුර නන්දසිරි මෙන්ඩිස්
38. තුසේතු ඇසිලින්නෝනා (මියගොස්)
39. රාජපකෂ මනික්කුනම්බි මොරිස්
40. කරුපන් පාත්තියම්
41. වීරක්කොන්ඩ ආරච්චි චිත්‍රා

42. ගලප්පත්ති ගුරුගේ බුද්ධදාස
43. දේහිංග සුනිල්
44. දේහිංග රත්නසිරි
45. දේහිංග සුජීවා දිල්හානි
46. පරාක්‍රමගේ නන්දසිරි
47. පාණ්ඩිගේ චන්ද්‍රපාල--
48. බඳුගොඩ හේවා බිටා
49. රාජපක්ෂ මනික්කුනම්බි සෝමවති
50. වැල්ලගේ සෝමලතා
51. හේමලතා පී.කේ
52. වැල්ලගේ සෝමවති
53. සූරියආරච්චිගේ කරුණාසේන
54. වීරක්කොන්ඩ ආරච්චි නන්දියතිලක
55. බින්දුගේ ප්‍රියකමල් නන්දන
56. ලොකුගේ සුනිල්
57. කුඩාවිදාන පත්මානන්ද
58. කාලිංග විජේසිරි
59. වීරක්කොන්ඩ ආරච්චි ඉනෝකා ශ්‍යාමලී
60. මහගොඩගේ කළ්‍යාණි
61. කාලිංග සරත් විජේසිරි
62. ගිනිගල් ගොඩගේ නන්දසිරි ද සිල්වා
63. කෝට්ටගේ ප්‍රසාද් මහීන්ද
64. රාජපක්ෂ පුංචනයිදාඩිනම්බි සමන්ත කුමාර
65. රකිනා වසම් ආනන්ද උපුල්
66. රණසිංහ හෙට්ටිආරච්චිගේ ලලිතා ගුණවර්ධන
67. අන්තිඳ මරක්කලකල ජයනි
68. කරපන් සාමෙල්
69. වීරක්කොඩි පත්මසිරි
70. ගලප්පත්ති සනි
71. සූරියආරච්චි කපිල
72. හඳුන්නෙත්ති ජයවීර මෙන්ඩිස්
73. වික්‍රමසිංහ ලියනආරච්චි ප්‍රියන්ත
74. රාජපක්ෂ මනික්කුනම්බි අනුෂා උදේනි
75. මහගොඩගේ කපිල
76. ගලප්පත්ති පොඩිහාමි
77. රනිල් තිලකරත්න

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහිදී අපි මතක් කරන්න ඕනෙ සුනාමි ව්‍යසනයත් සමග අම්බලන්ගොඩ නගරයට උත්ගතවුන තත්වයත් එක්ක පවුල් 84 ක් සඳහා නිවාස හදනු ලැබුවා. ඒ අයට ඔප්පු ලබා දීමට ක්‍රියා කරල තමන්ගෙ අයිතිය තහවුරු කිරීමට අවස්ථාව සැලසෙන වෙලාවක් මේක.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සුනාමි ව්‍යසනයට කලින් මේ ප්‍රදේශයේ පවුල් 14 ක් වගේ සංඛ්‍යාවක් හිටියා. අම්බලන්ගොඩ ධීවර වරාය සෑදීමේදී ඉවත් කරපු පවුල් 14 තමයි මම හිතන්නෙ එතන හිටියෙ. නගර සභාව සතු ඉඩමක නිවාස සංකීර්ණයක් ඇති කරල ජනතාවට ලබා දීල මේවන විට අවුරුදු හතක් අටක් විතර වෙනවා. මේ වනතුරු ඒ ජනතාවට ඒ නිවාස වල අයිතිය භුක්ති විඳින්න බැරි වෙලා තියෙනවා එහි අයිතිය නගර සභාව සතු නිසා. අද මේ ජනතාව විශාල අසාධාරණයකට ලක් වෙලා තියෙනවා පාසල් වලට ළමුන් ඇතුලත් කිරීම සම්බන්ධව. ඔප්පුවට ලකුණු 10 ක් ලබා දෙනවිට ඔප්පුවක් නැහැ කියන්නෙ ළමය පාසලකට ඇතුල් කිරීමේදී කෙලින්ම එයින් බැහැර වෙනවා. ප්‍රමාද වී හෝ මෙම ඔප්පුව ලබා දීම සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඔබතුමාටත් අපි ස්තූතිවන්ත වෙනවා. මේ ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතය වශයෙන් මම සතුටු වෙනවා ලබල වසරේ හරි ඒ දරුවන්ට මේ ඔප්පුවට ලැබෙන ලකුණු 10 ලැබෙනවා. ඒ නිසා ඉතා ඉක්මනින් මෙම කටයුත්ත කර නිම කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරී මහතුනි, මාධ්‍යවේදී මහතුනි, මෙම THW නිවාස හිමියන්ට ඔප්පු ලබා දීම පිළිබඳව අපි හදවතින්ම සතුටු වෙනවා. පල්ලියබඩවත්ත, හිරේවත්ත ග්‍රාම නිලධාරී වසම් වල ජනතාව මේ සුනාමි ව්‍යසනයත් එක්ක දලුක්කන්ද ප්‍රදේශයේ ඒවගේම ධම්මිකපුර ප්‍රදේශයේ පදිංචියට යොමු වුනේ. ඔවුන්ට දැඩි අසාධාරණයක් වුනා මේ ඔප්පු නැති වීම තුල. විශේෂයෙන්ම ධර්මාශෝක විද්‍යාලයට, දේවානන්ද විද්‍යාලයට සම්පූර්ණ ලකුණු 10 ක් ඔප්පුව නැති වීම තුල කැපෙනවා. අද වන විට මේ ජනතාව හුල්ලනව දැන් අවුරුදු හතක් අටක් තිස්සෙ ජාතික පාසල් දෙකට මීටර් 100 ක් 200ක් දුරක ඉඳල සැහෙන් අසාධාරණයකට ලක්වීම සම්බන්ධව. ඒවගේම ආසන්නතාවයට පාසල් වලට ලකුණු කැපීම තුල ඔවුන් විශාල අසාධාරණයට ලක් වෙලා තියෙනවා. මේ වසරෙ අසාධාරණයට ලක්වුන පිරිස 90 ගානක විතර පිරිසක් රැස්කරලා අපි සාකච්ඡා කරා. THW නිවාස, අශෝක උයන ඒ ප්‍රදේශවල ජනතාවට විශාල අසාධාරණයක් වෙලා තියෙනවා. එනිසා සභාපතිතුමනි මේ ඔප්පු ලබා දීම වගේම ඔවුන්ගේ දරුවන් ධර්මාශෝක විද්‍යාලය, දේවානන්ද විද්‍යාලය වැනි ජාතික පාසල් වලට ඇතුල් කිරීම සඳහා අවස්ථාව සලසා දීමත් සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව අපි ගිය අවුරුද්දෙත් කතා කරා. මේ අවුරුද්දෙත් කතා කරා. ඒත් කිසිම ප්‍රගතියක් නැහැ. මේ ප්‍රශ්නය එන්න එන්නම උග්‍ර අතර හැරෙනවා. මේ අවුරුද්දෙ පටබැදිමුල්ලෙන් ළමයි 12 ක් නැහැ. කන්දෙන් ළමයි 6 ක් නැහැ. හරිම ගැටලු සහගත තත්වයක්. එමනිසා සභාපතිතුමනි මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

- පෙ. ව. 10.00 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා සභා ගර්භයෙන් ඉවත්ව ගිය බැවින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මූලාසනයේ අසුන් ගන්නා ලදී.

ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි THW නිවාස හිමියන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ඉඩම් ලබා දීමේදී අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විශේෂයෙන්ම නීතිමය අනුමැතිය ලබා ගෙන දැනට මෙහි පදිංචි වාසීන්ට පිවත් වීමට අවස්ථාව සලසා දුන්නා.

- පෙ. ව. 10.05 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මූලාසනයේ අසුන් ගන්නා ලදී.

ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්

ඒ කටයුත්ත වැඩි දුරටත් ගෙනයමින් මේ නිවාසලාභීන්ට ඔප්පු ලබා දීම නගර සභාව මගින් ඉටු කිරීම සම්බන්ධව සතුටු වෙනවා. ඊට අමතරව 84 ක් විය යුතු ලැයිස්තුවේ 77 ක් තමයි දක්වල තියෙන්නෙ.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගෙවල් 84 ක් තියෙනවා. නාම ලේඛනයට එවල තියෙන්නෙ නම් 77 යි. ඒ ගැන ප්‍රාදේශීය ලේකම්ගෙන් විමසීමක් කරන්න. මේකෙ තවත් දෝෂයක් දැක්ක මම. ඉඩමේ නම නෙමෙයි මැනුමේ නම තියෙන්නෙ. වෙනත් නමක් තියෙන්නෙ ඒකත් සංශෝධනය කරන්න ඕනෙ.

- පෙ. ව. 10.05 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.

**<u>තීරණය</u>**

☞ ප්‍රාදේශිය මහ ලේකම්ගේ අංක ABM/LD/I/A9/47 හා 2013.10.30 දිනැති ලිපිය පරිදි THW නිවාස ලාභින් සඳහා ඔප්පු ලබාදිම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05:02:02** අප සභාවේ සේවය කළ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විශ්‍රාම යෑම හේතුවෙන් ඔහු විසින් ඉටු කරන ලද රාජකාරී දිනපතා ඉටු කල යුතු රාජකාරී බැවින් එකී කාර්යයන් ඉටු කිරීම සඳහා අප සභාවේ ඉල්ලීම පරිදි අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් දෙදෙනා එම කාර්යාලයේ රාජකාරී කරන කොට්ඨාශවලට ම අනුයුක්ත කරන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය දන්වා ඇති අතර ඒ අනුව එම කොට්ඨාශවල ඔවුන් දැනට සේවය කරනු ලැබේ.

එහෙත් අප සභාවේ අනුමත තනතුරුවල මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු එකක් පමනක් පවතින බැවින් වැඩ බැලීමේ දීමනාව ගෙවිය හැකි වන්නේ එක් නිලධාරියෙකුට පමණි. ඒ අනුව ඉහත පරිදි ප්‍රදේශයේ අප ආයතනයට අයත් මහජන සෞඛ්‍ය කටයුතුවල රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් ම. සෞ. පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතාට පමණක් වැඩ බැලීමේ දීමනාව ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 34/92 පරිදි මූලික වැටුපෙන් දෙකෙන් එකක් වන සේ රු. 9450/- ක දීමනාවක් මාසිකව ගෙවීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස සභාවට යෝජනා කර සිටිමි.

**<u>තීරණය</u>**

☞ **මහජන සෞඛ්‍ය පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතාට පමණක් වැඩ බැලීමේ දීමනාව ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 34/92 පරිදි මූලික වැටුපෙන් දෙකෙන් එකක් වන සේ රු. 9450/- ක දීමනාවක් මාසිකව ගෙවීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05:02:03** ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරීම පිළිබඳ පරිපාලන යෝජනාව

දකුණු පළාත් පාලන කොමසාරිස්තුමා විසින් අනුමත කරන ලද ප්‍රජා මණ්ඩල පරිපාලන යසඳහා සාමාන්‍ය ව්‍යවස්ථාව පරිදි අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 13 සඳහා පහත දිනයන් හිදී ප්‍රජා මණ්ඩල පිහිටුවන ලදී.

| අනු අංකය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය/ ප්‍රජා මණ්ඩලය | ප්‍රජා මණ්ඩලය පිහිටවූ දිනය |
|---|---|---|
| 01 | හිරේවත්ත ප්‍රජා මණ්ඩලය | 2013-08-09 |
| 02 | පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය | 2013-08-09 |
| 03 | කෙරමිණිය පින්නදූව ප්‍රජා මණ්ඩලය | 2013-08-11 |
| 04 | මහ අම්බලන්ගොඩ ප්‍රජා මණ්ඩලය | 2013-08-11 |

| | | |
|---|---|---|
| 05 | හෙප්පුමුල්ල ප්‍රජා මණ්ඩලය | 2013-08-11 |
| 06 | ඕකන්ද ප්‍රජා මණ්ඩලය | 2013-08-17 |
| 07 | කලුවඩුමුල්ල ප්‍රජා මණ්ඩලය | 2013-08-17 |
| 08 | විලේගොඩ ප්‍රජා මණ්ඩලය | 2013-08-17 |
| 09 | පොල්වත්ත ප්‍රජා මණ්ඩලය | 2013-08-18 |
| 10 | පනියන්දුව ප්‍රජා මණ්ඩලය | 2013-08-18 |
| 11 | පෝරඹ ප්‍රජා මණ්ඩලය | 2013-08-18 |
| 12 | තල්ගස්ගොඩ ප්‍රජා මණ්ඩලය | 2013-09-14 |
| 13 | කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය | 2013-09-14/2013-09-23 |

මෙම ප්‍රජා මණ්ඩල සක්‍රියව පවතනි අතර දකුණු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලියා පදිංචි කිරීම සුදුසු බව වාර්තා කරමි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහිදී කියන්න ඕනෙ අපි කොට්ඨාශ 13 ම සඳහා ප්‍රජා මණ්ඩල පිහිටෙව්වා. මහජනතාව සමග සමීපව කටයුතු කරන්න අවශ්‍ය නිසා තමයි මේවා පිහිටෙව්වෙ. මෙම කමිටු සභාවත් මහජනතාවත් අතර සමීප ඇසුරක් පවත්වාගෙන යාමට ඉවහල් වෙනවා.

<u>තීරණය</u>

☞ **ඉහත දක්වා ඇති ප්‍රජා මණ්ඩල දකුණු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- **පෙ ව 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදි.**

**05:02:04** ජාතික කියවීමේ මාසය - 2013 වෙනුවෙන් දරණ ලද වියදම් සඳහා අනුමැතිය ලබාගැනීමේ පරිපාලන යෝජනාව.

අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය මඟින් ජාතික කියවීමේ මාසය අරමුණු කර ගනිමින් නගර සභා බල ප්‍රදේශයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර 2013-09-11 දින සිට 2013-09-25 දින දක්වා පවත්වන ලද තරඟාවලිය සහ 2013-10-15 දින පවත්වන ලද ත්‍යාග සහ සහතික ප්‍රදානෝත්සවය වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ.

මෙම වියදම දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ජාතික කියවීමේ මාසය - 2013වියදම් වාර්තාව.**

| | |
|---|---|
| ◆ ත්‍යාග සඳහා වියදම | රු. 22615.00 |
| ◆ සහතික පත්‍ර සඳහා වියදම | රු. 16430.00 |
| ◆ සමරු තිළිණ සඳහා වියදම | රු. 10450.00 |
| ◆ ආරාධනා පත්‍ර සඳහා වියදම (ලියුම් කවර ඇතුළුව) | රු. 5750.00 |
| ◆ ලිපිගොනු කවර සඳහා වියදම | රු. 14725.00 |
| ◆ දැන්වීම් පත්‍රිකා සඳහා වියදම | රු. 7250.00 |
| ◆ නිල ලාංඡන සඳහා වියදම | රු. 2250.00 |
| ◆ උත්සවය සඳහා වර්ණාලෝකය | රු. 4500.00 |
| ◆ සමරු සිහිවටනය (වෙස් මුහුණ සහ වෙස් මුහුණ බහාලන ආවරණය) | රු. 3900.00 |
| ◆ විනිශ්චය මණ්ඩලයේ ගාස්තු සඳහා වියදම | රු. 12500.00 |
| ◆ විනිශ්චය මණ්ඩලයේ සංග්‍රහ සඳහා වියදම | රු. 5362.00 |
| ◆ ලිපිද්‍රව්‍ය සඳහා වියදම | රු. 2280.00 |
| ◆ උත්සව දින සංවිධාන වියදම (තොරණ නිර්මාණය/වේදිකාව සහ ශාලාව සැරසිලි) | රු. 10900.00 |
| ◆ උත්සව දින සංග්‍රහ සහ අතිරේක වියදම් (කිරි පැකට් ඇතුළුව රු.15000) | රු. 52777.50 |
| ◆ ඡායාරූප ඇල්බමය සඳහා | රු. 8910.00 |
| | රු. 180599.50 |

**"ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු.180599.50 මුදල සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරමි."**

තීරණය

☞ **ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු.180599.50 මුදල සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට සුදුසු බවට** ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 11- 26** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ**
**2013/11/26 දින පුස්තකාල කමිටු වාර්තාවයි.**

| | |
|---|---|
| ◆ එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | (ගරු නගර සභා මන්ත්‍රී) |
| ◆ එච්.එල්. අනුර කිත්සිරි මහතා | (ගරු නගර සභා මන්ත්‍රී) |
| ◆ ශාන්ති ඩී. රාමනායක මිය | (ප්‍රධාන කළමනාකාර සහකාර) |
| ◆ ඩබ්.පී. සිල්වා මිය | (ප්‍රජා සංවර්ධන නිලධාරී) |
| ◆ කේ.එච්. මෙලානි මධුෂා මිය | (පුස්තකාලයාධිපතිනි) |
| ◆ ටී. නදීකා නිල්මිණි මෙනවිය | (සංවර්ධන නිලධාරී) |
| ◆ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ◆ සිරිපාල මාදුවගේ මහතා | (කමිටු සාමාජික) |
| ◆ ටී.ඩබ්. පියසිරි මහතා | (කමිටු සාමාජික) |
| ◆ ටී.ඩබ්. හරිශ්චන්ද්‍ර මහතා | (කමිටු සාමාජික) |
| ◆ සුගත් හෙට්ටි ආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ◆ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ◆ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ ඒ.ඩබ්. ඉන්දදාස මයා | (පුස්තකාල සාහායක) |
| ◆ ගෞරී වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ ඒ.පී ලක්ෂමී පෙරේරා මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ ඒ.පී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ එම්.ඩබ්.ජේ. සුමංගලි මිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ කේ.ඒ. විසුද්ධි රේණුකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ◆ මාලතී ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව. 2.30ට සභාවේ වැඩ ආරම්භ කළේය.

- පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.

- ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ද, අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා එම ශාඛා භාර නිලධාරීන් විසින් ද, ඉදිරිපත් කරන ලදි. විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව සංවර්ධන සහකාර ටී. නදීකා නිල්මිණි මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදි.

<u>වෙනත් කරුණු :-</u>

- 2013 වසර සඳහා අළුතෙන් මිලදී ගත් පොත් ශාඛා පුස්තකාලවලට ලබා දුන්නේද යන්න ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියගෙන් විමසන ලදි. එතුමිය කියා සිටියේ සෑම ශාඛා පුස්තකාලයකටම එම පොත් ලබාදුන් බවයි. ප්‍රධාන පුස්තකාලයේ පොත් බැඳීම සුළු ප්‍රමාණයක් සිදුවන බැවින් ඒ සඳහා පුස්තකාල සාහායක සාහායිකාවන්ට පුහුණුව ලබාදිය යුතු බව තීරණය විය. පොත් බැඳීම සඳහා අවශ්‍ය උපකරණ නොමැති නිසා පොත් බැඳීම ප්‍රමාද වන බව පුස්තකාලයාධිපතිනිය පැවසුවාය. එම උපකරණ සඳහා වැයවන වියදම හා උපකරණ ලැයිස්තුව සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියට දන්වා සිටියේය. පුස්තකාල සේවා මණ්ඩලයට පොත් බැඳීම සඳහා අනුග්‍රහය ඉල්ලා ලිපියක් ලියා පුස්තකාල සාහායිකාවන්ටද පොත් බැඳීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට උපදෙස් දුන්නේය.

- පුස්තකාල සාහායක සාහායිකාවන්ගේ පරිගණක දැනුම සඳහා සිදුකළ පරීක්ෂණයේ වැඩි ලකුණු ගත් එල්.බී. තිළිණි භාග්‍යා, පී.එච්.එල්. පියන්ති යන මෙනවියන්ගේ හා කේ. නිරෝෂා, එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ යන මහත්මියන්ගේ ප්‍රතිඵල සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි. වැඩිදුර පුහුණුවට යවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් හෝ පුස්තකාල සේවා මණ්ඩලයට දන්වා ලියුම් යවා පුහුණුව ලබාදීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට පැවසීය. අනෙක් සාහායිකාවන්ටද මූලික පරිගණක පුහුණුව ලබාදීමට පුස්තකාල සේවා මණ්ඩලයට යවන ලෙස තවදුරටත් කරුණු දැක්විය. පොත් බැඳුම්කරු පී.එච්. බන්දුසිරි මහතාගේ දුවගෙන් පොත් පරිගණක ගත කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග හා උපදෙස් ලබාගන්නා ලෙස පුස්තකාලයාධිපතිනියට සභාපතිතුමා විසින් පවසන ලදි.

- ඡායා පිටපත් ලබා ගැනීමේදි කොපමණ මුදලක් ලබාගත යුතු බවද පුස්තකාලයාධිපතිනිය විසින් ගරු සභාපතිතුමාගෙන් විමසන ලදි. එම මිල ගණන් එතුමියට තීරණය කරන ලෙස සභාපතිතුමා පැවසීය. තනිපැත්ත රු.2.00ක් ද, දෙපැත්ත රු.3.00ක් ද, සුදුසු බව එතුමියගේ අදහස විය. පුස්තකාලයේ පුවත්පත් හා පොත් පමණක් ඡායා පිටපත් ලබාදීමට තීරණය විය. ඉහත සඳහන් මිල ප්‍රජා සේවාවක් වශයෙන් මිස මුදල් ඉපයීමේ අවශ්‍යතාවයක් නොවන බැවින් එම මුදල තීරණය විය. විද්‍යුත් තැපැල සඳහා ද මිලක් තීරණය කිරීමට පුස්තකාලයාධිපතිනියට පවසන ලදි. බ්‍රිතාන්‍ය කවුන්සිලයේත් පුස්තකාලයේත් විද්‍යුත් පුස්තකාලයේත් සාමාජිකත්වය ලබාගත් සාමාජික පාඨකයන්ට සංයුක්ත තැටි ද රැගෙන යාමට දෙන බැවින් විද්‍යුත් පුස්තකාලයේ අයට ද එම ක්‍රමය අනුගමනය කළයුතු බැව් කමිටු සාමාජික ජිනේන්ද්‍රවංශ මහතා පැවසීය. බ්‍රිතාන්‍ය කවුන්සිල් පුස්තකාලයට හා පුස්තකාල සේවා මණ්ඩලයට ගොස් එම සංයුක්ත තැටි පිටතට රැගෙන යාමට දෙන කොන්දේසි හා විස්තර සොයා බලන ලෙස සභාපතිතුමා පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. එයින් විද්‍යුත් පුස්තකාලය ක්‍රියාත්මකවීම පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි බැව් ජිනේන්ද්‍රවංශ මහතා පෙන්වා දුන්නේය.

- විද්‍යුත් පුස්තකාලයට පාඨකයින් ඉල්ලා ඇති සංයුක්ත තැටි මිලදී ගනීම සඳහා රු.5000.00ක මුදලක් ලබාදිය හැකිබවද, ගරු සභාපතිතුමා පැවසීය. පසුගිය වසරේ පුස්තකාලය සඳහා ලැබුණු සම්මාන, සහතික පත්‍ර පුස්තකාලයාධිපතිනිය විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. හොඳම පුස්තකාලය වශයෙන් ජයග්‍රහණය ලබා ගැනීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි. පොත් සංසරණ ප්‍රස්තාරය අනුව ශාඛා පුස්තකාලවලත් පොත් එකතුව හා සාමාජික සංඛ්‍යාව, විද්‍යුත් පුස්තකාලයේ සාමාජික සංඛ්‍යාව, අළුතෙන් ලැබුණු සංයුක්ත තැටි, අන්තර්ජාලය සඳහා ලැබෙන මුදල් එකම ප්‍රස්තාරයට ඇතුලත් කිරීමට සුදුසු බව කමිටු සාමාජික ජිනේන්ද්‍රවංශ මහතාගේ අදහස විය.

- මහ අම්බලන්ගොඩ ශාඛාවේ සේවය කරන එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මහත්මිය ප්‍රධාන පුස්තකාලයට අනුයුක්ත කොට එම ශාඛාවට වෙනත් නිලධාරියකු පත්කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය. පොත් බැඳීම ප්‍රමාද බැවින් ලබන වසරේ පොත් මිලදී ගැනීම සඳහා මුල් මාස 6ට එක ප්‍රමාණයකුත් අනෙක් මාස 6ට තව ප්‍රමාණයකුත් ලබාගැනීමට සුදුසු බව සභාපතිතුමාගේ තීරණය විය. එයට කමිටු සාමාජිකයෝද කැමති වූහ.

- සාහිත්‍ය උත්සවය මෙවර ඉතාමත් අලංකාර ලෙස පැවැත්වීම ගැන පුස්තකාලයට අළුතෙන් පැමිණි පුස්තකාලයාධිපතිනියට කමිටු සාමාජික සුගත් හෙට්ටි ආරච්චි මහතා ස්තුතිය පුද කළේය. සාහිත්‍ය උත්සවය නිවේදනය කරන ලද නිවේදක මහතා ආරාධිත ජයලත් මනෝරත්න මහතා ගැන කිසිදු හැඳින්වීමක් නොකිරීම අඩුපාඩුවක් බැව් ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පෙන්වා දුන්නේය. මෙයට පසු ආරාධිත දේශකතුමා ගැන නිවේදක මහතාට විස්තරයක් ලබාදීම පළමුව කළයුතු බවද ජිනේන්ද්‍රවංශ මහතා කරුණු දැක්වූයේය.

- මේ අවස්ථාවේදී සනත් සේනාරත්න මහතා හා ඉන්දු වර්සවිතාන මහත්මිය විසින් පොත් 66ක් ගරු සභාපතිතුමා වෙත පරිත්‍යාග කරන ලදි. මෙයින් පසු ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා විසින් රචිත "විශ්වය හා සසල හිරු" නම් කෘතියෙන් පිටපත් 3ක් ද ගරු සභාපතිතුමා වෙත පරිත්‍යාග කරන ලදි. පොත් පරිත්‍යාග කරන ලද එම තිදෙනාටම සභාපතිතුමා ස්තුතිය ප්‍රකාශ කළේය. ජිනේන්ද්‍රවංශ මහතා ලබාදුන් පොත් 3න්, 1ක් මහ අම්බලන්ගොඩ ශාඛාවට හා දෙකක් ප්‍රධාන පුස්තකාලයටත් දෙන ලෙස ඉල්ලා සිටියේය.

- කමිටු රැස්වීම් හා උත්සව වාර්තා Face book (මුහුණු පොත) ඇතුලත් කරන ලෙස සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියගෙන් ඉල්ලීමක් කරන ලදි. හොඳම පුස්තකාලය තේරීමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනූ යාපනය පුස්තකාලය නැරඹීමට හා එයින් පුස්තකාලය දියුණුවන අන්දම, පවත්වාගෙන යන ක්‍රියාමාර්ග අනුගමනය කොට අම්බලන්ගොඩ පුස්තකාලය එම තත්වයට ගැනීමට ක්‍රියාකළයුතු බැව් සභාපතිතුමා පැවසුවේය.

- එම නිසා යාපනය පුස්තකාලය බැලීමට යන ලෙස සභාපතිතුමා පුස්තකාල කාර්ය මණ්ඩලයට පැවසුවේය. ඒ සඳහා දින 2ක් පුස්තකාලය විවෘත නොකරන බැවින් අධ්‍යයන චාරිකාවට සහභාගිවන බැවින් සඳහන් කොට දැන්වීමක් දමන ලෙසත් පුස්තකාලයාධිපතිනියට පැවසීය.

- ප්‍රධාන පුස්තකාලයේ සේවක පිරිසගේ හා ශාඛාභාර නිලධාරින්ගේ නම් ද තනතුරු ද සඳහන් කොට දැන්වීම් පුවරුවක් මගින් මහජනතාවට දැකගැනීමට සලස්වන ලෙස සුගත් හෙට්ටි ආරච්චි මහතා ඉල්ලීමක් කළේය. එයට සභාපතිතුමා විසින් අනුමැතිය දෙන ලදි. අම්බලන්ගොඩ නගරය හා පුස්තකාලය ඇතුලත් ලිපි පලකිරීමට දැන්වීම් පුවරුවක් අවශ්‍ය බැව් ද පුස්තකාලයාධිපතිනිය ප්‍රකාශ කළේය. එම දැන්වීම් පුවරු සැදීමට කටයුතු කරන ලෙස පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය.

- පාඨක අදහස් පොත් බැලීමෙන් පසු ගරු සභාපතිතුමා එයට අවශ්‍ය දේවල් ලබාදීමට කටයුතු කරන ලෙස පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. හෙප්පුමුල්ල ශාඛාවේ "රාවය" පත්‍රය පාඨකයින් අඩු පිරිසක් බලන නිසා ඒ වෙනුවට "ඉරිද රිවිර" පත්‍රය ලබාදීම සුදුසු බැව් පැවසුවේය. "අද" පත්‍රය සෑම පුස්තකාලයකටම ලබාදීමට කටයුතු කරන ලෙසත් සභාපතිතුමා ප්‍රකාශ කළේය.

වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ස්තුති කතාව සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතාට ආරාධනා කළේය. එහිදී එතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි ගරු නාගරික මන්ත්‍රී අනුර කිත්සිරි මහතා ද, ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියත්, ප්‍රධාන කළමනාකාර සහකාර තුමියත්, කමිටු සාමාජික මහතුන්, පුස්තකාලයාධිපතිනිය, ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩලයටත්, ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි කළ්‍යාණි මහත්මිය අපිට පොත් පරිත්‍යාගයක් කරා. ඒ ගැන මේ වාර්තාවෙ සඳහනක් නැහැ. මම මතක් කරන්නෙ එතුමියට ස්තුති කරල ලිපියක් යවන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ මහත්මියට ස්තුති කර ලිපියක් යවන්න.

ඒවගේම " අද පත්‍රය " සෑම පුස්තකාලයකටම ලබා ගන්න කියල යෝජනා කරල තියෙනවා. එයත් ස්ථිර කරන ලෙස ඉල්ලා සිටනවා.

**ඒ අනුව 2013 -11- 26 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 11- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

## පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව

**2013.11.20 ප.ව. 2.30**

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| ❖ | ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ | භාරත සමරසේකර මහතා | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ | වෛද්‍ය පී.ආර්.එන්.ද.සිල්වා මිය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී අම්බලන්ගොඩ, |
| ❖ | එල් එච්.බී මංජුල මහතා. | ම. සෞ. පරීක්‍ෂක බරවා රෝග මර්ධන |
| ❖ | පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්‍ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ | ඩබ්.එන්.අයි මෙන්ඩිස් මහතා. | ම.සෞ.පරීක්ෂක. අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ | එස්.ඩී. නන්දනී මිය | ප්‍රාදේශීය පරිසර නිලධාරී. |
| ❖ | එච්. නයනා චාන්දනි මිය | සං. සම්බන්ධීකාරක ප්‍රා ලේ අම්බලන්ගොඩ. |
| ❖ | පී.එච්. කුමාර ද සිල්වා මහතා. | ග්‍රාම නිලධාරී 86 බී කෙරමිණිය |
| ❖ | එස්. එච්. අජිත් ද සිල්වා මහතා. | ග්‍රාම නිලධාරී 86 ඒ කලුවඩුමුලල. |
| ❖ | එස්.එන්. මානවඩු මහතා. | ග්‍රාම නිලධාරී 82 බී හිරේවත්ත. |
| ❖ | එම්.ඒ. ධම්මික ධර්මසේන මහතා | ග්‍රාම නිලධාරී 85 පටබැදිමුල්ල. |
| ❖ | ඒ.කේ. කාන්ති සිල්වා මිය. | ග්‍රාම නිලධාරී 86 සී පෝරඹ |
| ❖ | පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය | සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ | ඩබ්.පී සිල්වා මිය | ප්‍රජා සංවර්ධන නිලධාරී (වැඩබලන) |
| ❖ | බී.ඩී.ඊ කොඩිතුක්කු මිය | ප.සෞ.සේ නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ | ඩී.එස්.ඊ. ගමගේ මිය. | ප.සෞ.සේ නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ | පී. කුසුම් ද සිල්වා මිය | කළමණාකරණ සහකාර |
| ❖ | එම්.ඩබ් හිරාන් සංජීව මහතා | සෞඛ්‍ය පරිපාලක |

**පිළිගැනිම :- ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**

සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටුව සඳහා පැමිණි සෞ.වෛ.නි. මිය ඇතුළු අනෙකුත් සියලුම රජයේ නිලධාරි මහත්ම මහත්මීන් නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ඩෙංගු මර්දන සතිය 2013.10.07 සිට 13 දක්වා සිදුකරන ලද වැඩසටහනෙහි ප්‍රගතිය**

| අනු අංකය | දිනය | වැඩසටහන | ආවරණය වන ප්‍රදේශය | සහභාගීත්වය |
|---|---|---|---|---|
| 01 | 2013.10.07 | සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන පරික්ෂාව | නගර සභා බල ප්‍රදේශය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| 02 | 2013.10.08 | බස් ඩිපෝ ,සුසාන භූමි,පොදු ස්ථාන පරික්ෂාව | අම්බලන්ගොඩ බස් ඩිපෝව පොල්වත්ත හා පටබැඳිමුල්ල සුසාන භූමි. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| 03 | 2013.10.09 | කසල අවසන් බැහැරලන ස්ථානයේ මැස්සන් බෝවීම වැලැක්වීම සඳහා පලිබෝධ නාශක බෙහෙත් ඉසීම, නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි කාණු පද්ධතිය පිරිසිදු කිරීම හා පොදු ස්ථානවල ධූමායන කටයුතු සිදු කිරීම. | හල්වතුර කසල අවසන් බැහැරලන ස්ථානය අම්බලන්ගොඩ නාගරික කලාපය | මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්, රියදුරු හා සෞඛ්‍ය කම්කරු මහතුන් |
| 04 | 2013.10.10 | ඉදිකිරීම් වැඩබිම්, අත්හැර දැමූ ඉඩම්,මහා මාර්ග, දුම්රිය මාර්ග දෙපස අවධානම් කලාප පරික්ෂාව. | නගර සභා බල ප්‍රදේශය | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| 05 | 2013.10.11 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිස් ස්ථානය සහභාගීත්වය ඇතිව ඩෙංගු රෝග මර්දන සමීක්ෂණ වැඩසටහනක් පැවැත්වීම, අත්පත්‍රිකා බෙදා හැරීම. | නගර සභා බල ප්‍රදේශය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී |
| 06 | 2013.07.04 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිස් ස්ථානය සහභාගීත්වය ඇතිව ඩෙංගු රෝග මර්දන සමීක්ෂණ වැඩසටහනක් පැවැත්වීම. අත්පත්‍රිකා බෙදා හැරීම. | නගර සභා බල ප්‍රදේශය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහජන සෞඛ්‍ය පරීක්ෂක පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී |

**දැයට සෙවණ ජාතික රුක් රෝපණ වැඩසටහනෙ 2013.11.15 දින සිදු කරන ලද වැඩසටහනෙහි ප්‍රගතිය.**

ඉහත වැඩසටහන තල්ගස්ගොඩ පෙර පාසල් භූමිය තුළ එදින ක්‍රියාත්මක කරන ලද බව පරිසර නිලධාරී පවසන ලදි. ඉතිරි පැළ අනෙකුත් නගර සභා පෙර පාසල් ඉඩම් තුළ සිටුවන බව පවසන ලදි

**තල්ගස්ගොඩ පාලම අසල කසල දැමීම තව දුරටත් සිදුවන බව**

**තීරණය**

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

මෙය දැඩි ලෙස බලපාන ගැටළුවක් බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති තුමා වෙත ලිපියකින් මේබව දැනුවත් කරන ලෙස දන්වන ලදි. ගොඩහේන තිලකපුර ආදී ප්‍රදේශවල ජනතාව විසින් මෙම කසල දැම්ම සිදු කරන බවට අදහස් පල විය.

**කලුවඩුමුල්ල පඤ්ඤාලෝක මාවත අවසන් කොටස ජලයෙන් යටවීම**

සෞඛ්‍ය පරිපාලක එම්.ඩබ් හිරාන් සංජීව මහතා

මෙම ප්‍රදේශය වගුරු ස්වභාවයක් ගන්නා අතර නිරන්තරයෙන් ජලය රැදී පැවතීම සිදු වන බව පවසන ලදි. මෙම මාර්ගය ඉස්සිම තුළින් මෙම ප්‍රශ්නය විසදා ගත හැක.

**තීරණය**

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

මේ පිළිබඳව වැඩ අධිකාරී එම්.ඩබ් සිසිර කුමාර මහතාගෙන් වාර්තාවක් ලබා ගන්නා ලෙස දන්වන ලදි.

**සෞඛ්‍ය පරිපාලක එම්. ඩබ්. හිරාන් සංජීව මහතා**

බුද්ධදත්ත මාවත අග කොටස ඇති කාණුවේකොන්ක්‍රිට් ලෑලි ගැලවුවහොත් කැඩී යාමට ඉඩ ඇති බැවින් එම කාණු පිරිසිදු කිරීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බව පවසන ලදි.

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

කසල අවසන් බැහැර කරන ස්ථානයේ කසල තුනී කිරිම සඳහා D4D යන්ත්‍රයක් යොදා ගැනීම සුදුසු බව පවසන ලදි.

❖ **වෙනත් කරුණු**

**ග්‍රාම නිලධාරී එස්. එච්. අජිත් ද සිල්වා මහතා.**

ධීරක්කන්ද මාවත දයාරත්න මහතාගේ නිවස අසල විශාල වලවල් ඇති බවත් එම මාර්ගයේ ගමන් කරන අය වලවල් වල වැටීම නිසා රෝහල් ගත වී ඇති බවත් පවසන ලදි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

ඉදිරියේ දී එම මාර්ග යථා තත්වයට පත් කරන බවත්, පසුගිය කාල පරිච්ඡේදය තුළ තාර නොතිබීම නිසා ප්‍රමාද වූ බවත් පවසන ලදි.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මිය.**

සුව කැදැල්ල වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සභාපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලද සහායට ස්තුතිය පුද කරන බවත් පවසන ලදි. එමෙන්ම පටබැදිමුල්ල සායන මධ්‍යස්ථානයේ පොල් ගස කැපීම පිළිබඳවත් ස්තුතිය පුද කරන බවත් පවසන ලදි.

**ප.සෞ.සේ නිලධාරී බී.ඩී.ඊ කොඩිතුක්කු මිය.**

දීර්ඝ කාලයක් තිස්සේ නොවිසදී තිබුණු ගැටළුවක් වන පටබැදිමුල්ල සායන මධ්‍යස්ථානයේ පොල් ගස කැපීම පිළිබඳව  ස්තුතිය පුද කරන බවත් එම ගොඩනැගිල්ලේ වහල සකස් කර දෙන ලෙසත් පොල් ගසෙහි කොටස් තවමත් ඉවත් කර නොමැති බවත් පවසන ලදි.

**ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**
**තීරණය**

වහල සකස් කිරීම වැඩ අධිකාරී සිසිර මහතාට දැනුම් දෙන ලෙසත්, පොල් ගසෙහි කොටස් ඉවත්කර ඒ අසල ඇති ජෑම් ගසෙහි අතු කප්පවා දැමීම හිරාන් සංජීව මහතා විසින් සිදු කළ යුතු බවත් පවසන ලදි.

ම. සෞ. පරීක්ෂක බරවා රෝග මර්ධන එල් එච්.බී මංජුල මහතා.

හික්කඩුවේ පැවති ඩෙංගු රෝග මර්දන වැඩසටහන සඳහා නගර සභාවේ ධූමායන කටයුතු සිදු කරන යන්ත්‍රය ලබා දීම සම්බන්ධව ස්තුතිය පුද කරන බවත් පවසන ලදි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

ධූමායන කටයුතු නගර සභා සේවකයන්ට පුහුණු කරන ලෙස දන්වන ලදි.

**ග්‍රාම නිලධාරී පී.එච් කුමාර ද සිල්වා මහතා.**

වතුගෙදර බෝගහ අසල ඉදිරිපිට කාණුව අවහිර වී ඇති බව පවසන ලදි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

වැඩ පරිපාලක එම්.ඩබ් හිරාන් සංජීව මහතාට මේ පිළිබඳව සොයා බලන ලෙස දැනුම්දෙන ලදි.

ග්‍රාම නිලධාරී එම්.ඒ ධම්මික ධර්මසේන මහතා

බෞද්ධ මධ්‍යස්ථානය ඉදිරිපිට බොක්කු තුළින් ජල සම්පාදන මණ්ඩලයට අයත් වතුර බටයක් දමා තිබීම නිසා වැසි කාලයේදී කාණුව අවහිර වන බව පවසන ලදි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

**තීරණය**

මේ පිළිබඳව ජල සම්පාදන මණ්ඩලයට ලිපියකින් දනුම් දෙන ලෙස දන්වන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

ලබන වර්ෂයේ සිට ගර්භණී මව්වරුන් සඳහා චිත්ත රෙදි හා පෝෂණ වැඩසටහන් සිදු කිරිම සඳහා අයවැයෙන් මුදල් වෙන් කර ඇති බවත් එම මව්වරුන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි බවත් පවසන ලදි.

- ❖ **ලැබී ඇති ලිපි සභාවට ඉදිරිපත් කිරීම.**

තල්ගස්ගොඩ ප්‍රදේශයේ අයාලේ යන සුනඛයින් නිසා මිනිසුන් වෙත සිදුවන අපහසුතාව පිළිබඳ ඉදිරිපත් කර තිබු ලිපිය සාකච්ඡාවට භාජනය විය.

**ම. සෞ. පරීක්ෂක, පී. එස්. එස්. ද සිල්වා මහතා.**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය විසින් පවත්වනු ලබන සුනඛ වන්ද්‍යාකරන සැත්කම් වැඩසටහන මිට මාස දෙකකට පෙර පටබැදිමුල්ල ප්‍රදේශයේ සිදුකර ඇති බව පවසන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**

එවැනි වැඩසටහනක් තල්ගස්ගොඩ ප්‍රදේශයට ද ලබා දුනහොත් මෙම ප්‍රශ්නය විසදා ගැනිමට හැකිවනු ඇත.

**තීරණය**

මේ වර්ෂය සඳහා තවත් එක් සායනයක් ලබා දෙන ලෙස ප්‍රධාන අමාත්‍ය තුමාට ලිපියකින් දැනුම් දෙන ලෙස පවසන ලදි.

**<u>ස්තූති කථාව</u>**

**නගර සභා ලේකම් භාරත සමරසේකර මහතා.**
අම්බලන්ගොඩ නගරයේ සෞඛ්‍ය කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා සභාපතිතුමා ගන්නා වූ ප්‍රයත්නයට ස්තූතිය පුද කරමි. අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදි.

**ඒ අනුව 2013 -11- 20 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 11- 25** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම</u>**

දිනය - 2013.11.25
ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව
වේලාව - ප.ව. **2.30**

**<u>සහභාගීත්වය</u>**

ඇම්.ඩබ්.අරුණ ප්ර2දීප් මහතා - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව
ඒ.ඩබ්.ජගත් කුමාර මහතා - නගර සභා මන්ත්රීප , අම්බලන්ගොඩ නගර සභාව
එම්.ඩබ්.රාහුල ලලිතවික්රñම මහතා - නගර සභා මන්ත්රීk , අම්බලන්ගොඩ නගර සභාව
එච්.එල්.අනුර කිත්සිරි මහතා - නගර සභා මන්ත්රී , අම්බලන්ගොඩ නගර සභාව
ආර්.පි.දේව් රොහාන් මහතා - නගර සභා මන්ත්රීත , අම්බලන්ගොඩ නගර සභාව
ජී.අශෝක කුමාර මහතා - ක්රීනඩා උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව
සුගත් හෙට්ටි ආරච්චි මහතා - ක්රීමඩා කමිටු සාමාජික
මහේන්ද්රට වික්රාමසිංහ මහතා - ක්රීාඩා කමිටු සාමාජික
එම්.ඩබ්.ෂර්ලි චන්ද්සිරි මහතා - ක්රීටඩා කමිටු සාමාජික
එස්.කේ.පත්මසිරි මහතා - ක්රීරඩා කමිටු සාමාජික
ආර්.ජී.නිමල් චන්ද්රාසිරි මහතා - ක්රීාඩා කමිටු සාමාජික
ඩී.වී.සුනිල් මහතා - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
එම්.ඩබ්.ෂර්ලි පද්මසිරි මහතා - ක්රීඅඩා කමිටු සාමාජික
එච්.වයි.ද සිල්වා මහතා - ක්රී්ඩා භූමි භාරකරු - නගරසභාව
කසුන් ගාල්ලගේ මහතා - ක්රීාඩා නිලධාරී , ප්රා දේශීය ලේකම් කාර්යාලය
ඉඳුනිල් එදිරිවික්රවමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු අම්බලන්ගොඩ නගර සභාව
ලක්ෂිමන් තිලකසිරි සිල්වා මහතා - බැඩ්මින්ටන් සංගමය, අම්බලන්ගොඩ
ජේ.ජයවීර මහතා - රොටරි ක්රීමඩා සමාජය

කේ.ජේ.තාබ්රේවච් මහතා - සොනෙල් ක්රි්ඩා සමාජය
ඩබ්.පී.සිල්වා මිය -
සංවර්ධන සහකාර (ප්ර්.සං. නිලධාරි වැ.බ)

**පිළිගැනීම - ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්ර දීප් මහතා.**

ක්රීගඩා කමිටුව සඳහා කිරති ඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්,පාසල් වලින් පැමිණි ක්රි ඩා භාර ආචාර්ය මහතුන් , ක්රිඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින්, ප්රිථමයෙන්ම කෙටිකාලයක් හෝ අප නගර සභාවේ ක්රීරඩා පුහුණු කරුවෙකු වශයෙන් සිටි, කුසුම් නන්දසිරි මහතා හදිසියේ අභාවප්රා ප්ත වූ බැවින් ඒ සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් ප්රිකාශ කරමින් ශෝකය ප්ර කාශ කරන ලදි.

ඉන් අනතුරුව න්යා්ය පත්රානනුකූලව ප්ර ථමයෙන්ම පසුගිය ක්රි ඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

**නගර ක්රීඩා තරඟ පිළිබඳ කරුණු විමසා සිටින ලදි.**

එහිදී ක්රිකට් තරඟ හා මේස පන්දු තරඟ පැවැත්වීම පිළිබඳ විමසා සිටි අතර

**අශෝක කුමාර මහතා**

ක්රිාකට් තරඟ දෙසැම්බර් 02 දින ආරම්භ කරන බවත් , දෙසැම්බර් 15 වන දින අවසන් තරඟ පැවැත් වීමට නියමිත බවත්, මේස පන්දු තරඟ දෙසැම්බර් 02 දින ආරම්භ වන බවත් කියා සිටින ලදි.

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රදදීප් මහතා.**

**පොල්වත්ත පොදු ක්රී ඩාංගනයට පොදු වැසිකිළියක් ලබා දීම පිළිබඳ සාකච්ඡා කල අතර , එම කාර්යය ඉටු කර ඇති බවට වැඩ අධිකාරී තුමා විසින් ලබා දෙන ලද වාර්තාව කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.**

ප්රාලදේශිය ලේකම් කාර්යාලයේ සිටින ක්රීලඩා නිලධාරි මහතාට තමා භාරයේ ඇති වටිනා ක්රී1ඩා භාණ්ඩ තබා ගැනීම සඳහා ස්ථානයක් ලබා දීම පිළිබඳ සාකච්ඡා කරන ලදි.

ක්රීමඩා මණ්ඩපයේ පිහිටා ඇති මෙයට පෙර අනුර ක්රීඩා සමාජය සඳහා ලබා දී තිබූ කාමරය ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබූ අතර එම කාමරයේ ධර්මාශෝක විද්යා ලයට අයත් ක්රී ඩා උපකරණ ඇති බව එච්.වයි.ද සිල්වා මහතා විසින් ප්රාකාශ කරන ලදි.
ඒ පිළිබඳ විමසීමට අද දින ක්රී.ඩා කමිටුව සඳහා ධර්මාශෝක විද්යාලය නියෝජනය කරමින් කිසිවෙකු සහභාගී වී නොමැති බැවින් අදාල නිලධාරියාට එය භාර දීම සඳහා අවශ්යව කටයුතු කරන ලෙස දන්වන ලදි.

තීරණය - **ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රසදීප් මහතා.**

අනුර ක්රි ඩා සමාජය සඳහා දී තිබූ කාමරය සතියක් ඇතුළත ලේකම්තුමා, අභ්යන්තර ගිණුම් නිලධාරි හා ආදායම් පරිපාලක විසින් කාමරයේ ඇති සියළුම භාණ්ඩ ලැයිස්තු ගත කර සතියක් ඇතුලත ප්රාදේශිය ලේකම් කාර්යාලයේ ක්රීඩා නිලධාරියාට ලබා දෙන ලෙසට නියෝග කර ලිපියක් නිකුත් කරන ලෙස දන්වා සිටින ලදි.

**අදහස් හා යෝජනා**
**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්ර දීප් මහතා**
**අම්බලන්ගොඩ ප්රාදේශයේ වෙරළ පාපන්දු ක්රී්ඩාව නංවා ලීම සඳහා වෙරළ පාපන්දු පිටියක් ලබා ගැනීමට හැකියාවක් ඇති බවත් ඒ සඳහා දළ සැලැස්මක් ලබා දෙන ලෙස දන්වන ලදි.**

ඉඳුනිල් එදිරිවික්රතමසූරිය මහතා

වෙරළ පාපන්දු ක්‍රීඩා පිටියේ දළ සැලැස්ම දෙසැම්බර් 01 දිනට පෙර ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදි.
එමෙන්ම පාපන්දු ක්‍රීඩාව සඳහා පාපන්දු නෙට් ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමා වෙත ස්තුතිය ප්‍රකාශ කරන ලදි.

**අශෝක කුමාර මහතා**
**ක්‍රිකට් පැති විකට්ටු සඳහා දැලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.**
**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා**
**ඒ සඳහා ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.**

**අශෝක කුමාර මහතා**
**පොල්වත්ත පොදු ක්‍රීඩාංගනයේ පොදු වැසිකිළිය සෑදීම පිළිබඳ ස්තුතිය ප්‍රකාශ කර අතර ක්‍රීඩා මණ්ඩපය පින්තාරු කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.**
**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**
**පින්තාරු කිරීම සඳහා වැඩ අධිකාරීගෙන් ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.**

මහේන්ද්‍ර. වික්‍රමසිංහ මහතා
සුපුරුදු ඉල්ලීම නැවත වරක් ඉදිරිපත් කරන බවත් ක්‍රීඩා පිටියේ වියා යාම කරන ස්ථානයේ පස් තුනී කිරීම සිදු කර නොමැති බැවින් එම ස්ථානයේ පස් තුනී කිරීම කරවා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**අශෝක කුමාර මහතා**
**ඒ පිළිබඳ කර්මාන්ත පරිපාලක සමඟ සාකච්ඡා කර බවත් , පස් තුනී කරවා දෙන බව ප්‍රකාශ කළ බවත් කියා සිටින ලදි.**
**බැඩ්මින්ටන් සංගමයේ සභාපති තුමා අද දින කමිටුව සඳහා සහභාගී නොවන බවට ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපති තුමා විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.**

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා**
**බැඩ්මින්ටන් ක්‍රීඩා ගාරය නිසි අයුරින් නඩත්තු නොකරන බව හා පොදු පහසුකම් නිසි අයුරින් පවත්වාගෙන නොයන බවට චෝදනා ඉදිරිපත් වන බව කියා සිටින ලදි.**
**තවද බැඩ්මින්ටන් සංගමයේ කටයුතු චෝදනා එන ලෙස පවත්වාගෙන නොයන ලෙසත් එසේ වුවහොත් පවරා ගැනීමට සිදුවන බවත් කියා සිටින ලදි.**

ලක්ෂොමන් තිලකසිරි සිල්වා මහතා -
**පොදු පහසුකම් පිළිබඳ (වැසිකිළි පහසුකම්) ප්‍ර ශ්නයක් ඇති බවත් එම පහසුකම් සපුරාලන බවත් කියා සිටින ලදි.**

මහේන්ද්‍රි වික්‍රමසිංහ මහතා
**ක්‍රීඩා පිටියේ ඇති සුන්බුන් ඉවත් තර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.**
**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**
**බැකෝ එකක් යොදවා ඒවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දැන්වූ අතර , එය මිල ගණන් කැඳවා අවම මිල ගණන් යටතේ ලබා ගෙන වැඩ අධිකාරිගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලෙස දන්වන ලදි.ඒ සඳහා සභාවෙන් මුදල් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.**

එච්.එල්.අනුර කිත්සිරි මහතා
ක්‍රීඩාවල අනන්‍යතාවය පවත්වාගෙන ක්‍රීඩා කිරිමට හැකිවන අයුරින් අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේ පහසුකම් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**
**අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේ ක්‍රීඩා තරඟ පවත්වාගෙන යාමට හා උත්සව පවතින අවස්ථාවල දී විදුලි ආලෝකය විධිමත් අයුරින් පැවතිය යුතු අතර , ඒ ඒ අවස්ථාවලදී ප්‍රයෝජනයට ගත හැකි**

**අයුරින් විදුලි ආලෝක පද්ධතිය සකස් කිරිම සඳහා වැඩ අධිකාරීගෙන් ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙසට උපදෙස් ලබා දෙන ලදි.**

එමෙන්ම ධීවර සංකීර්ණය පින්තාරු කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස ද දන්වා සිටින ලදි.

එස්.කේ.පද්මසිරි මහතා
ක්රී්ඩාවල අනන්යපතාවය පවත්වාගෙන ක්රීකඩා කිරිමට හැකිවන අයුරින් සකස් කරන ලද ජාත්යවන්තර ක්රී්ඩා නීතිරිති පොතක් ඇති බවත් ඉන් එක් පොතක් ගරු සභාපති තුමාට ලබා දෙන බවත් කියා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්ර දීප් මහතා**
**තමාට එය පෞද්ගලිකව අවශ්ය නොවන බවත් පුස්තකාල සඳහා පොත් 3 ක් ලබා ගන්නා ලෙසටත් උපදෙස් ලබා දෙන ලදි.**

එස්.කේ.පද්මසිරි මහතා
**එක් පොතක් ඇ.ඩොලර් 65 ක් පමණ වන බව පවසන ලදි.**
**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රනදීප් මහතා**
**එය මිලදී ගන්නා ලෙසට උපදෙස් දෙන ලදි.**

කසුන් ගාල්ලගේ මහතා
අම්බලන්ගොඩ ප්රාහදේශිය ලේකම් කාර්යාලයේ නව ක්රීමඩා නිලධාරීයා වශයෙන් අද දින වැඩ භාර බවත් අම්බලන්ගොඩ ප්රශදේශයට හොඳ ක්රීකඩාපිටියක් ලබා ගත හැකි ඇති බැවින් ඒ සඳහා රජය සමඟ සාකච්ඡාවක් ලබා ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදි.

**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රනදීප් මහතා**
ක්රීයඩා ඇමතිතුමා සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා ලිපියක් යොමු කරන ලෙස දන්වන ලදි.

මහේන්ද්රි වික්රමමසිංහ මහතා
පසුගිය දා පැවති පාපන්දු සංගමයේ රැස්වීමේදී අම්බලන්ගොඩ ලීගයේ සභාපති වශයෙන් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්රිදීප් මහතා පත් වූ බව ප්රයකාශ කල අතර ඒ සඳහා ප්රමසාදය පල කර සිටින ලදි.
ක්රි.ඩා පිටියේ දේවානන්ද විද්යාමලය පැත්තේ ඇති කාණුව වසා දමන ලෙසට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි.

**තීරණය , ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රලදීප් මහතා**
වැඩ අධිකාරීතුමාගේ වාර්තාවක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබාදුනි.

කසුන් ගාල්ලගේ මහතා
නගර ක්රීලඩා උළෙලේ දී පැසි පන්දු ක්රීඋඩා තරඟ පැවැත්වීම සම්බන්ධයෙන් ස්තුතිය පල කරන ලදි.

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්රුදීප් මහතා**
නගර ක්රිතඩා තරඟ පැවැත්වීමේ ප්රදධාන පරමාර්ථය වුයේ නගරයේ දරුවන්ගේ ක්රී ඩා කුසලතා නැංවීමවන අතර ඒ සඳහා ප්රඟධාන පාසලේ කණ්ඩායම සහභාගි නොවීම කණගාටුවට කරුණක් බව කියා සිටින ලදි.

තවද නගර සභා ක්රීඳඩා පිටිය වටා ඇති කාණුව සකසා දෙන ලෙසට ඉල්ලීමක් කරමින් ක්රිවකට් ආයතතනයේ සභාපතිතුමා වෙත ලිපියක් යවන ලෙස උපදෙස් ලබා දුනි.

ඉඳුනිල් එදිරිවික්ර මසූරිය මහතා
පාපන්දු සංගමයේ සභාපති තුමාගෙන් ගෝල් පෝස්ට් දෙකක් ලබා දෙන ලෙසට ඉල්ලිමක් කරමින් ලිපියක් යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදි.
පාපන්දු සංචිතය සඳහා 15 පහළ ක්රීඳඩකයින් 30 ක් තෝරා ගන්නා ලෙසට පුහුණුකරුට උපදෙස් දුනි.

**ගරු සභාපති - නීතිඥ ඇම්.ඩබ්. අරුණ ප්ර3දීප් මහතා**
පාපන්දු තරඟාවලියේ දක්ෂ ම ක්රිඩකයින් 30 දෙනෙකු තෝරා ගෙන වසර පහක් පුරා පුහුණු කිරීමට සහා අනුමැතියක් ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දුනි.

ආර්.පී.දේව් රොහාන් මහතා -
අද දින තම වටිනා කාලය හා ශ්ර මය කැප කරමින් කමිටුව වෙත පැමිණ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරිම වෙනුවෙන් ගරු නගර සභා මන්ත්රීවරුන්ටත්ක්රිණඩා සමාජ , පාසල් නියෝජනය කරමින් පැමිණි නිලධාරින් හා නගර සභාවේ නිලධාරීන් ඇතුළු සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

**ඒ අනුව 2013 -11- 25 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 11- 28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාව**

සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීමේ වාර්තාව

දිනය - 2013.11.28 වේලාව - ප.ව. 2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

**පැමිණීම**

1. එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා - සභාපති, නගර සභාව ,අම්බලන්ගොඩ
2. ඩී.ඩබ්. පත්මසිරි මහතා - ගණකාධිකාරී, නගර සභාව ,අම්බලන්ගොඩ.
3. ශාන්ති ඩී. රාමනායක මිය - ප්‍රධාන කළමණාකරන සහකාර,නගර සභාව
4. එම්.පී. ආර්. පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව අම්බලන්ගොඩ
5. එච්. ඩබ්. මහින්දසේන මහතා - කමිටු සාමාජික
6. කමලසිරි වරුෂවිතාන මහතා - කමිටු සාමාජික
7. පී.බඩී. ගුණසිරි මහතා - කමිටු සාමාජික
8. බර්ටි රණසූරිය මහතා - කමිටු සාමාජික
9. ඩී.ආර්..ජී.ජයසේකර මිය - කමිටු සාමාජික
10. යූ.සමරසිංහ මහතා - කමිටු සාමාජික
11. පී.පී.ආරියරත්න මහතා - කමිටු සාමාජික

**ගරු සභාපති තුමා අද දින රැස්වීමට ප්‍රමාද වී පැමිණි බැවින් අම්බලන්ගොඩ නගර සභාවේ ගණකාධිකාරී** ඩී.ඩබ්. පත්මසිරි මහතා විසින් විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

1. 2014 වර්ෂයේ අයවැය යෝජනා සඳහා ප්‍රමුඛතා ගත කරන ලද ඇස්තමේන්තු ඇතුලත් ව සකස් කළ අයවැය ලේඛණය සඳහා ඇතුලත් කිරීමට අවසාන වශයෙන් සකස් කරන ලද අයවැය යෝජනා මුද්‍රණය කර සියළු සාමාජිකයන්ට බෙදා දෙන ලදි. ගණකාධිකාරී විසින් පවසන ලද්දේ ප්‍රජාවගෙන් ලබා ගන්නා ලද යෝජනා සියල්ල 2014 අයවැය සඳහා ඇතුලත් කර ඇති බවය.
2. කමිටු සාමාජික යූ.සමරසිංහ මහතා අදහස් දක්වමින් අම්බලන්ගොඩ කුලරත්න මාවත සකස් කිරීමෙන් අනතුරුව සුදු ඉර දෙපස මඟීන්ට ගමන්කිරීමට ඇති ඉඩ ප්‍රමාණවත් නොවන බැවින් , මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ සඳහා පිළියමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

2.1 එසේම ධම්මානන්ද මාවත කාණුව කොන්ක්‍රීට් ලෑලි වලින් සකස් කර දෙන ලෙස ද ඉල්ලා සිටින ලදි. එක් එක් අංශ සඳහා වෙනම වැඩ සැලැස්මක් සකස් කිරීම යෝග්‍ය බව ද පෙන්වා දෙන ලදි.

3. සෞඛ්‍ය අංශයේ සේවකයන් ග්ලවුස් ආදිය පැලඳ නොසිටීම පිළිබඳව ද කරුණු ඉදිරිපත් කළ අතර ඒ සඳහා නියෝග නිකුත් කිරීමට පියවර ගත යුතු බව ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදි.

4. ප්‍රදේශයට බලපාන අපදා තත්ත්වයන් පිළිබඳව කමිටුව සළකා බලන ලදි. එහි දී පහත සඳහන් ආපදාවන් පිළිබඳව අවධානය යොමු කළ යුතු බව ට සාකච්ඡා විය. ගං වතුර, හදිසි ගිනි ගැනීම් , හදිසි කුණාටු තතත්වයන්, ධීවරයන්ට බලපාන ආපදාවන්,ඩෙංගු තත්ත්වයක් හට ගැනීමට ඇති අවකාශයන්,වදුරන්ගෙන් වන ආපදාවයන් ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බව පෙන්වා දෙන ලදි.

4.1 ගංවතුර තත්ත්වයක් ඇති වීමට ප්‍රධාන හේතුවක් වශයෙන් මෝයකට තිබෙන ස්ථානයේ හිරේවත්ත ඇනිකට් එක වේලාවට ඇරීම වැසීම සිදු නොවන බවත්, ඔයිල් කිරීම වේලාවට සිදුවීම පිළිබඳව විමසීමක් කළ යුතු බවත් පෙන්වා දෙන ලද අතර මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් හමුවී හෝ සාකච්ඡාවක් කිරීමටත් , අනෙකුත් රාජ්‍ය ආයතන සමග සාකච්ඡාවක් කිරීමටත් සුදුසු බව පෙන්වා දෙන ලදි.

4.2 එසේම, ගංවතුරට යටවන තැන් පිළිබඳව හදුනා ගැනීමක් කළයුතු බවත් ඒ සඳහා සෑම ග්‍රාමසේවා වසමකම තොරතුරු එකතු කිරීමට ප්‍රජා නියෝජිත මහත්ම මහත්මීන් සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.

5. ඩෙංගු මර්ධන වැඩසටහන් නගර සභාව මගින් ක්‍රියාත්මක කරන බවත්, ධූමායන කටයුතු සඳහා මැෂින් එකක් නගර සභාව මගින් මිළ දී ගෙන ඇති බවත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ධූමායන කටයුතු බල ප්‍රදේශය පුරා මේ වන විට ක්‍රියාත්මක කරන බවත් ගරු සභාපති තුමා විසින් පෙන්වා දෙන ලදි.

6. ධීවරයන් මුහුදට ගිය පසු ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව හා හදිසි අවස්ථාවක දි කෙසේ ක්‍රියා කළ යුතු ද යන්න පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සුදුසු බවට සාකච්ඡා වු අතර ඒ සඳහා රෙඩ් ක්‍රොස්(Red Cross) ආයතනයේ සහය ලබා ගැනීමට හැකි බවද ගරු සභාපති තුමා විසින් පවසන ලදි.

7. ගලවන ලද පාලම වැලිකොට්ට මත තිබෙන බැවින් ගග මැදට වැටීමෙන් ගංවතුර තත්වයක් වුවද ඇති වීමේ අවදානමක් ඇති බැවින් මේ පිළිබඳව දුම්රිය දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙස ද සභාපති තුමා විසින් දන්වා සිටින් ලදි.

8. ස්වාභාවික මුහුදු තටාකය මුහුදු වැලි වලින් වැසියාම පිළිබඳව පරීක්ෂාවක් කර වාර්තාවක් ලබා දෙන ලෙස නාරා ආයතනයෙන් ඉල්ලීමක් කිරීමට ද දන්වා සිටින ලදි.

9. ආදාහනාගාරය අසළ එක් පැත්තක් සකස් කරන විට අනෙක් පැත්තෙන් ද මුහුදු ඛාදනය වීමට ලක් වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ඉල්ලීමක් කළ යුතු බව ද සභාපති තුමා විසින් පෙන්වා දෙන ලදි.

**10. අවදානම් තත්ත්වයන් සියල්ල පිළිබඳව සලකා බැලූ කමිටුව ප්‍රදේශයට බලපාන ආපදාවන් වල දි ජනතාව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳවත් , එහි දී ඇතිවන තත්ත්වයන්ට අවශ්‍ය වන සම්පත් පිළිබඳවත්, සම්බන්ධතා පවත්වා ගත යුතු ආයතන ,පුද්ගලයන් ආදි විස්තර ඇතුලත් කර ආපදා කළමණාකරන සැළැස්මක් සකස් කර බෙදාහැරීමට සංවර්ධන උපදේශක් කාරක සභාව නිර්දේශ කරන ලදි.**

ගරු සභපති තුමා විසින් ස්තුති කථාව සිදු කරන ලදි. එහිදී අදහස් දක්වමින්, 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත අයවැය සඳහා සංවර්ධන යෝජනා සහ ප්‍රදේශයට බලපාන ආපදා තත්ත්වයන් පිළිබඳව අදහස් ලබා දීමට සහයෝගය ලබා දෙමින් ස්වෙච්ඡාවෙන් අද දින පැමිණ සහභාගී වු කමිටු නියෝජිත මහත්ම මහත්මීන් සියළු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

ඒ අනුව **2013 -11- 28** දින පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

### 7:1 ටෙන්ඩර් :-

**7:1:1** 2014 වර්ෂය සඳහා බස් නැවතුම්පොල පොදු වැසිකිළිය බදු දීම සඳහා ප්‍රසම්පාදන කැඳවනු ලදුව සේවය අත්‍යවශ්‍ය බැවින් සහ පසුගිය වර්ෂයේ මිළ ගණන් සසඳා බැලීමෙන් ද ලැබී ඇති රු. 7500/- මිල ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | මාසික ටෙන්ඩර් මුදල | පසුගිය වර්ෂයේ අවම ටෙන්ඩර් මුදල |
|---|---|---|---|
| 01 | පද්මසිරි ආරච්චිගේ අනුර<br>මුහුදු වෙරළ පාර, පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ | **7500/-** | 7100/- |
| | | | |

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙතන වැසිකිළිය සඳහා එක් එක් ගණන් අය කරනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අය කරන නියමිත මුදල සඳහන් කරල එතන බෝඩ් එකක් ගහන්න.

### 7:2 මිල ගණන් :-

**7:2:1 CFL** බල්බ් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් ස්පිරල් ටයිප් බල්බවල මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පොලික්‍රොම් ඉලෙක්ට්‍රිකල්ස් | පූර්ණ හාඩ්වෙයාර් | |
|---|---|---|---|---|---|
| 01 | CFL බල්බ් | 200 | **357/-** (18W) | 355/- | U type |
| | | | 376/- (23W) | 425/- | Spiral Type |

**7:2:2** වාහන අමතර කොටස් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රුහුණු මෝටර්ස් | රත්න මෝටර්ස් | ඇම්. සෙනෙවිරත්න සමාගම |
|---|---|---|---|---|---|
| 01 | 750 X 16 රිම් | 03 | 7100/- | **6750/-** | 7100/- |
| 02 | 600 X 16 රිම් | 02 | 5100/- | **4750/-** | 5100/- |
| 03 | 12-4 X 28 රිම් | 01 | 32500/- | **31000/-** | 33000/- |
| 04 | Hyd Hose with valve | 06 | 4800/- | **4350/-** | 4500/- |
| 05 | එයාර් ක්ලිනර් හෙඩ් | 03 | 2100/- | **1950/-** | 2300/- |
| 06 | හිච් සෙට් | 01 | 26000/- | **24500/-** | 26000/- |

**7:2:3** කම්ප්‍රෙෂර් යන්ත්‍රය සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Gowell Machines | Macwin Traders | Cambridge |
|---|---|---|---|---|---|
| 01 | එයාර් කම්ප්‍රෙෂර් 200 l | | 68000/- | **67750/-** | 85000/- |
| | | | 78000/- | | |

**7:2:4** ක්‍රීඩා භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පී.ඩී.එම්. ස්පෝර්ට්ස් ගුඩ්ස් | කාවින්දි ස්පෝර්ට්ස් ගුඩ්ස් | ගිත්මි ස්පෝර්ට්ස් ගුඩ්ස් |
|---|---|---|---|---|---|
| 01 | ලෙදර් බෝල | | 600/- | 650/- | **575/-** |
| | | | | | |

## (08) ගෙවීම්

8\. 1 ඇ. අංක 0745 යටතේ ලබා ගත් ක්‍රීඩා භාණ්ඩ සඳහා කොළඹ 05, තිඹිරිගස්යාය ස්පෝර්ට්ස් කෝනර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 12000/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Foot Ball Goal Net - 12000/-

8.2 ඇ. අංක 0750 යටතේ ලබා ගන්නා ලද Gas වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

37.5kg Lp Gas 8 X 7240/- - 57920.00

8.3 ඇ. අංක 0757 යටතේ ලබා ගත් තාර සඳහා මුතුරාජවෙල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 414000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

තාර බැරල් 25 X 16560/- - 414000.00

8.4 ඇ. අංක 0699, 0714 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගල් වෙනුවෙන් අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ, කේ. කේ. සුමිත් ප්‍රියන්ත මෙන්ඩිස් මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 54450/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 1 ½ Metal Cube | 11 X 3950/- | - | 43450.00 |
| Metal Chips Cube | 02 X 5500/- | - | 11000.00 |
| | | | 54450.00 |

8.5 ඇ. අංක 0709 යටතේ ලබා ගන්නා ලද Gas වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මයා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

37.5kg Lp Gas 8 X 7240/- - 57920.00

8.6 ඇ. අංක 0734 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද වාහන බැටරි වෙනුවෙන් ගාලු පාර, අම්බලන්ගොඩ, ආර්. පී. ඇල්ෆ්‍රඩ් ද සිල්වා සහ සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 32610/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

90A Exide Battery 02 X 16305 - 32610/-

8.7 ඇ. අංක 0737 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් මහාවිදිය, අම්බලන්ගොඩ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11700/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| A4 Packets (White) | 20 X 575/- | - 11500/- |
| Puncher | 01 X 200/- | - 200/- |
| | | 11700/- |

8.8 ඇ. අංක 0710,0731 යටතේ ජාතික කියවීමේ මාසය උත්සවය වෙනුවෙන් ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, කුලරත්න පාර සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 47055/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Invitation cards | 200 X 28/75 | - | 5750/- |
| Certificates | 310 X 53 | - | 16430/- |
| File Cover | 310 X 47/50 | - | 14725/- |
| Badges | 450 X 5 | - | 2050/- |
| Envelop | 200 X 3/25 | - | 650/- |
| Posters | 500 X 14/50 | - | 7250/- |
| | | | 47055/- |

8.9 ඇ. අංක 0691යටතේ විද්‍යුත් පුස්තකාලය සඳහා ලබාගත් පරිගණක උපාංග වෙනුවෙන් ගාලු පාර, අම්බලන්ගොඩ, Tulip Computers වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 565400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

CPU 11 X 34600/- - 380600.00

| | | | |
|---|---|---|---|
| Monitor | 11 X 11700/- | - | 128700.00 |
| Keyboard | 11 X 400 | - | 4400.00 |
| Mouse | 11 X 400 | - | 4400.00 |
| UPS | 11 X 4300 | - | 47300.00 |
| | | | 565400.00 |

8.10 ඇ. අංක 0299 යටතේ මහජන පුස්තකාලය, විද්‍යුත් පුස්තකාලය නාම පුවරු සැකසීම හා සමරු ඵලකය සැකසීම වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර සමාරා ප්ලාස්ටික් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 92500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| මහජන පුස්තකාලය නාම පුවරුව | - | 56000.00 |
| විද්‍යුත් පුස්තකාලය නාම පුවරුව | - | 18500.00 |
| විද්‍යුත් පුස්තකාලය සඳහා සමරු ඵලකය | - | 18000.00 |
| | | 92500.00 |

8.11 ඇ. අංක 0711, 0736 යටතේ ලබා ගත් දමරු තිළිණ සඳහා වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර සමාරා ප්ලාස්ටික් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12850/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| සමරු තිළිණ | 22 X 475/- | - | 10450.00 |
| සමරු සිහිවටන | 01 X 2400/- | - | 2400.00 |
| | | | 12850.00 |

8.12 ඇ. අංක 0306, 0307 යටතේ සකසා ගන්නා ලද ඩිජිටල් බැනර් සඳහා අම්බලන්ගොඩ, මහාවිදිය ඇක්රා ෆොටෝ ෂොප් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14670/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Digital Banner | 1 X 2500/- | - | 2500.00 |
| Digital Banner sticker | 1 X 2720/- | - | 2720.00 |
| Digital Banner | 6 X 1575/- | - | 9450.00 |
| | | | 14670.00 |

8.13 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 33858.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4275 | ඩීසල් | 56 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4290 | ඩීසල් | 34 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4291 | ඩීසල් | 45 |
| 4299 | ඩීසල් | 67 |
| 4309 | ඩීසල් | 62 |

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීම ට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා**

**මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද දෙකකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.14 නගර සභාව සතු 53 - 0529 අංක දරණ කැබ්රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12110.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4276 | ඩීසල් | 50 |
| 4306 | ඩීසල් | 50 |

8.15 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13805.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4277 | ඩීසල් | 65 |
| 4305 | ඩීසල් | 49 |

8.16 නගර සභාව සතු GL- 9369 අංක දරණ ගලිබවුසර රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13208.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4297 | ඩීසල් | 90 |
| | DS 30 Engine oil | 05 |

8.17 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ඔක්තෝම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11319.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4284 | ඩීසල් | 41 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4301 | ඩීසල් | 43 |

8.18 නගර සභාව සතු 49- 9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ඔක්තෝම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10354.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4286 | ඩීසල් | 39 |
| 4311 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 02 |

8.19 නගර සභාව සතු LF- 1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12352.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4317 | ඩීසල් | 31 |
| 4337 | ඩීසල් | 71 |

8.20 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2013 ඔක්තෝම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17114.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4338 | ඩීසල් | 140 |
| | බැටරි වතුර | බෝතල් 2 |

8:21 2013 සැප්තැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11453 I | 49693.39 |
| 23453 I | 1268.00 |
| 34453 I | 2913.63 |
| 52453 I | 58313.40 |
| 53454 | 17794.63 |
| 62453 I | 20898.91 |
| | 150881.96 |

විදුලි බිල්පත් සඳහා රු. **150881.96** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:22 2013 අගෝස්තු මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 52453 II | 25505.10 |
| 62453 II | 14741.16 |

| | |
|---|---|
| 34453 II | 720.16 |
| 23453 II | 16652.24 |
| 11453 II | 6688.64 |
| | 64307.30 |

ජල බිල්පත් සඳහා රු: **64307.30** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:23 2013 සැප්තැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11452 | 32150.15 |
| 12452 | 1163.28 |
| 25451 II | 2551.53 |
| 62452 I | 1163.28 |
| | **37028.24** |

දුරකතන බිල්පත සඳහා රු **37028.24** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.24 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා ඔක්තෝම්බර් මාසයට සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 36690/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 2013 ඔක්තෝම්බර් මස වැට් බදු ආපසු ගෙවීම සඳහා රු. 50000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 විලේගොඩ වරිපනම් අංක 2/30 අසලින් යන හරස් පාර හා කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 44029.69 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 ඕකන්ද පෙර පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ (අතිරේක) රැඳවුම් මුදල වන රු. 26389.32 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 හිටපු අම්බලන්ගොඩ නගරාධිපති මිවෙල් සිල්වා මහතාගේ නිවස අසළින් ඇති පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම් මුදල වන රු. 389619.38 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 2013 නගර ක්‍රීඩා තරගාවලියේ ඉදිරි තරග සඳහා සංග්‍රහ/ දීමනා සඳහා වියදම් දැරීමට රු. 20000.00 ක අත්තිකාරම් මුදලක් සභා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය ලබා ගැනීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30) ඔප්පු අංක G/010/CT/15238 දරණ මුදල් ආරක්ෂණ ඔප්පුවේ කාලය 2013/12/10 දිනෙන් අවසන් වන බැවින් 2014 වර්ෂයට අලුත් කිරීම සඳහා රු. 37050.65 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:31) 2013 ඔක්තෝම්බර් මාසය තුල කාර්යාල වේලාවෙන් බැහැරව එකතු කරන ලද හිඟ වරිපනම් මුදල් වෙනුවෙන් රු. 15903.05 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එච්. ටී. සී. එච්. ද සිල්වා මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:32) දුව සුමනසාර මාවත අතුරු මාර්ගයේ කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් කෙරම්ණිය කුඩා ගම්මාන සමිතිය වෙත රු. 413370.32 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- පෙ. ව. 10.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.
- පෙ. ව. 10.30 ට පමණ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදී.
- පෙ. ව. 11.30 ට පමණ කාරක සභා අවස්ථාව අවසන් කරන ලදී.

8:33) මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගයේ කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් කෙරම්ණිය කුඩා ගම්මාන සමිතිය වෙත රු. 493981.79 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:34) සුදුවැල්ල පළවන හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් සුදුවැල්ල කුඩා ගම්මාන සමෘද්ධි සමිතිය වෙත රු. 641136.16 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:35) මහ අම්බලන්ගොඩ නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත රු. 802334.28 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:36) පටබැඳිමුල්ල පැරණි ආයුර්වේද ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ කාය වර්ධන මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 1 වන අදියර පළමු කොටස් ගෙවීම වන රු. 714726.09 ක මුදලක් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:37) පටබැඳිමුල්ල පැරණි ආයුර්වේද ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ කාය වර්ධන මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2 වන අදියර පළමු කොටස් ගෙවීම වන රු. 361396.94 ක මුදලක් ශ්‍රී මේධානන්ද මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:38) ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ගේ ඔක්තෝම්බර් මාසයේ ගමන් වියදම් දීමනාව වෙනුවෙන් රු. 21000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:39) 2013-11-22 දින කසල තුනී කිරීම සඳහා පැය 10 1/2 කාලයක් බැකෝ යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් රු. 19950/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ත්‍රිමාවිතාන කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 ඔක්තෝම්බර් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 ඔක්තෝම්බර් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10:1** හිරේවත්ත පුස්තකාලය අසල ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් වැඩ අධිකාරී මහතා විසින් සකස් කරන ලද රු. 92346.60 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) තල්ගස්ගොඩ පාරේ සිට බුද්ධදත්ත මාවත දක්වා යෝජිත මාර්ගය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 1892353.32 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) මුහුදුවෙරළ පාර කොටසක කාණු කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 1131929.92 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වල ජල සම්බන්ධතාවය සෑපුවම කඩ හිමියන් වෙත ලබා දීම සඳහා ජල සම්පාදන මණ්ඩලයේ වැඩභාර නිලධාරී විසින් සකස් කරන ලද රු. 81212.30 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වල ජල සම්බන්ධතාවය සෑපුවම කඩ හිමියන් වෙත ලබා දීම සඳහා සකස් කරන ලද රු. 81212.30 ක් වූ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (11) වෙනත් කරුණු

**11:1** " විදේශ සංචාරය සඳහා අනුමැතිය ලබා ගැනීම " මැයෙන් නගර සභා මන්ත්‍රී ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013-12-14 දින සිට 2013-12-25 දින දක්වා තමා වන්දනා චාරිකාවක් සඳහා විදේශගත වීමට නියමිත බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය 2013-12-14 දින සිට 2013-12-25 දින දක්වා විදේශගත වීම වෙනුවෙන් අනුමැතිය ලබා දීමට සභාව තීරණය කරන ලදී.**

**11:2** " චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම " මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ගණකාධිකාරීතුමා විසින් ඉදිරිපත්කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම සභාවේ ලේකම් තනතුර සඳහා 2013-11-06 දින සිට ස්ථාන මාරු ලැබ පැමිණි භාරත සමරසේකර මහතාට අම්බලන්ගොඩ නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත ගිණුම් සඳහා චෙක්පත්වල දෙවන අත්සන අත්සන් කිරීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

| | | |
|---|---|---|
| මහජන බැංකුව<br>අම්බලන්ගොඩ | ජංගම ගිණුම් අංක | 035-1-001-2-6295234<br>035-1-001-0-6295876<br>035-1-001-6-6295883<br>035-1-001-4-6295638<br>035-1-001-1-6296205<br>035-1-001-8-0002102 |
| | ඉතිරි කිරීමේ ගිණුම් අංක | 035-2-001-3-8585503<br>035-2-001-9-6318575 |

| | | |
|---|---|---|
| | ස්ථාවර තැන්පත් ගිණුම් අංක | 035-561-900359-7<br>035-507-900343-4 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව අම්බලන්ගොඩ | ඉතිරි කිරීමේ ගිණුම් අංක | 1-0033-03-5554-2<br>1-0033-02-4462-7<br>1-0033-02-4777-4<br>1-0033-02-8389-4 |
| ලංකා බැංකුව | ස්ථාවර තැන්පත් ගිණුම් අංක | 2-000562-1-2857666<br>2-000527-0-2857667<br>2-000528-8-2857668<br>2-000018-9-2857532 |

ඉහත සඳහන් ගිණුම් සඳහා චෙක්පත්වල දෙවන අත්සන තැබීමට බලය පවරා තිබූ ඩී. වී. සුනිල් මහතාගේ අත්සන් තැබීමේ බලය අවලංගු කිරීම සඳහා ද අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම සභාවේ ලේකම් තනතුර සඳහා 2013-11-06 දින සිට ස්ථාන මාරු ලැබ පැමිණි භාරත සමරසේකර මහතාට අම්බලන්ගොඩ නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන ඉහත ගිණුම් සඳහා චෙක්පත්වල දෙවන අත්සන අත්සන් කිරීමට බලය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**11:3** “ 2013 වර්ෂයේ වසා ඇති වෙළඳ ව්‍යාපාර වෙළඳ බලපත්‍ර ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා වූ නාම ලේඛණය ” මැයෙන් ආදායම් පරිපාලක මිය විසින් ඉදිරිපත්කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

**<u>වසා ඇති වෙළඳ ව්‍යාපාර</u>**

| **01:13 ඇඹරුම් හල්** | | **ගාස්තුව** | **VAT** | **STAMPS** | **R.P** | **<u>මුලු එකතුව</u>** |
|---|---|---|---|---|---|---|
| පී ජී සිරියාවතී | 23 පල්ලෙතොට පාර තල්ගස්ගොඩ | 750 | 90 | 75 | 30 | 945 |
| **01:17 එළවළු පළතුරු විකිණීම** | | | | | | |
| පී එච් තනුෂිකා ගයාත්‍රී | 129 ගාලු පාර අම්බලන්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |
| ඩබ් ශාන්ත කුමාර | 149 තල්ගස්ගොඩ හංදිය තල්ගස්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **01:29 හෝටල්** | | | | | | |
| කළමනාකරු රොමේෂ් හෝටලය | 03 පොල්වත්ත වෙළඳ සංකීර්ණය | 1000 | 120 | 100 | 30 | 1250 |
| **03:06 ඉංග්‍රීසි බෙහෙත් ශාලා** | | | | | | |
| එම් ඒ කුරුප්පුආරච්චි | 02 පොල්වත්ත වෙළඳ සංකීර්ණය | 1200 | 144 | 120 | 30 | 1494 |
| **03:13 කාර්යාල** | | | | | | |
| කළමනාකරු ග්ලෝබල් සිකියුරිටි | 03 පරණ ඇල්පිටිය පාර අම්බලන්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |
| **03:25 ටේලර් සාප්පු** | | | | | | |
| සුගත් ප්‍රසන්න | 56/08 අළුත් පාර අම්බලනගොඩ | 1200 | 144 | 120 | 30 | 1494 |
| **03:31 තොග ගබඩා** | | | | | | |
| එම් එෆ් එම් ෆයාස් | 138 මහවීදිය අම්බලන්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |
| **03:38 දුරකතන සේවා** | | | | | | |
| එස් ඩබ් එන් ද සිල්වා | 19ඒ වික්‍රමසූරිය පාර අම්බලන්ගොඩ | 1200 | 144 | 120 | 30 | 1494 |
| **03:56 පාසල් පොත් ලිපිද්‍රව්‍ය** | | | | | | |
| ගිනිගේ පියරත්න ද සිල්වා | 112ඒ ගාලු පාර අම්බලන්ගොඩ | 1200 | 144 | 120 | 30 | 1494 |
| **03:59 ප්‍රදර්ශනාගාර** | | | | | | |
| එම් එෆ් එම් ෆාරිස් | 11ඩී ගාලු පාර අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| ඕ කේ සිරිපාල | 27 වික්‍රමසූරිය පාර අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| **03:62 ප්‍රචාරක දැන්වීම් පුවරු ආයතන** | | | | | | |
| වසන්ත විදානපතිරණ | 341 මහවීදිය අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| **03:76 මසා නිමි ඇඳුම්** | | | | | | |
| එම් කේ එම් හිල්මි | 58 අලුත් පාර අම්බලන්ගොඩ | 1200 | 144 | 120 | 30 | 1494 |
| එම් එස් ඒ නජිම් | 53/1 අලුත් පාර අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| **03:78 මොටර් රථ වාහන අමතර කොටස් අලෙවිය** | | | | | | |
| නිමල් ශ්‍රී ලාල් සෙනවිරත්න | 05 ගාලු පාර අම්බලන්ගොඩ | 1500 | 180 | 150 | 30 | 1860 |
| **03:79 මොටර් බයිසිකල් වෙළදාම** | | | | | | |
| සමන් සී අත්තනායක | 09 ගාලු පාර අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| **03:95 වීඩියෝ පට කුලියට දීම** | | | | | | |
| එන් බී යොහාන් ද සිල්වා | 42බී ගාලු පාර අම්බලන්ගොඩ | 1200 | 144 | 120 | 30 | 1494 |
| කේ එම් සී ගුරුගේ | 05 සතොස ගොඩනැගිල්ල අම්බලන්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |
| **03:113 සිල්ලර වෙළදාම** | | | | | | |
| කේ ටී විමලාවති | 238 මහවීදිය අම්බලන්ගොඩ | 750 | 90 | 75 | 30 | 945 |
| **03:136 පාවහන් අලෙවිය** | | | | | | |
| සමන් මෙන්ඩිස් | 233 මහවීදිය අම්බලන්ගොඩ | 1000 | 120 | 100 | 30 | 1250 |
| ආර් කේ මනෝජ් ප්‍රියංග | 50ඒ ගාලු පාර අම්බලන්ගොඩ | 2000 | 240 | 200 | 30 | 2470 |
| | | **29200** | **3504** | **2920** | **660** | **36284** |

අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ පැවති 2013 වෙළඳ බලපත්‍ර ලේඛණයේ ලියාපදිංචි වී ඇති නමුත් වසර මැදදී වසා දමන ලද වෙළඳ ව්‍යාපාර ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☛ **2013 වෙළඳ බලපත්‍ර ලේඛණයේ ලියාපදිංචි වී ඇති නමුත් වසර මැදදී වසා දමන ලද වෙළඳ ව්‍යාපාර ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** " අම්බලන්ගොඩ විද්‍යාල මාවත යහසාධක සංගමය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩම් කොටසක් ලබා දීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

මේ සම්බන්ධව කටයුතු කල හැක්කේ නගර සභා ආඥා පනතේ අංක 36 (ඉ)(I),(II) වගන්ති අනුව සභාව සතු දේපලක් විකිණීම, හුවමාරු කිරීම, කුළියට දීම හෝ බදු දීම යන කාර්යන්ට පමණක් එකී දේපල සභාව සතුවූ සාධන පත්‍රවල සඳහන් කොන්දේසි හා නියමයන්ට යටත්ව හා එම දේපල යථා කාලයේදී පොදු කාර්යන් සඳහා අවශ්‍ය නොවේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව බාහිර පාර්ශවයන්ට ලබා දිය හැකි බවත් නමුත් මෙම යහසාධක සංගමයේ ඉල්ලීම ඉහත කාර්යන් වලට අයත් නොවන බවත් ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☛ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව විද්‍යාල මාවත යහසාධක සංගමය සඳහා ඉඩම් කොටසක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' පෙර පාසල් දරු දැරියන් සඳහා නිල ඇඳුම් ලබා ගැනිම - 2014 ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා පෙර පාසල් දරු දැරියන් 210 දෙනෙකු වෙනුවෙන් 2014 වර්ෂය වෙනුවෙන් නිල ඇඳුම් ලබා දීම සඳහා කමිස රෙදි (45" පළල) යාර 210 ක් සහ කලිසම් / සාය සඳහා රෙදි (60" පළල) යාර 210 ක් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☛ **පෙර පාසල් දරු දැරියන් වෙනුවෙන් 2014 වර්ෂය සඳහා නිල ඇඳුම් ලබා දීමට අවශ්‍ය කමිස රෙදි යාර 210 ක් සහ කලිසම් / සාය සඳහා රෙදි යාර 210 ක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' 2013 ජුනි මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 06 ක් බවත් පැමිණි රෝගීන් ගණන 135 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 23 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 14122.68 ක් බවත් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු. 104.61 ක් බවත් දන්වා තිබුණි.

තීරණය

☛ **2013 ජුනි මස වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:3** ' 2013 ජුලි මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 08 ක් බවත් පැමිණි රෝගීන් ගණන 59 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 7 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 6793.52 ක් බවත් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු. 115.14 ක් බවත් දන්වා තිබුණි.

තීරණය

☛ **2013 ජුලි මස වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:4** ' 2013 අගෝස්තු මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 06 ක් බවත් පැමිණි රෝගීන් ගණන 100 ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 17 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු. 12040.43 ක් බවත් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු. 120.40 ක් බවත් දන්වා තිබුණි.

තීරණය

☛ **2013 අගෝස්තු මස වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:5** ' පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

2013 ජනවාරි සිට අගෝස්තු දක්වා ගලිබවුසරයෙන් ලද ආදායම රු. 1096555.00 ක් බවත් වියදම රු. 653295.81 ක් බවත් මාස 8 තුල මාසික සාමාන්‍ය අතිරික්තය රු. 55407.40 ක් බවත් ඒ අනුව ගලි බවුසරය සඳහා සේවකයෙකු බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සලසන ලෙසත් දන්වා තිබුණි.

තීරණය

☛ **දිස්ත්‍රික් කමිටු මිළ ගණන් යටතේ ගලි බවුසරය සඳහා සේවකයෙකු බඳවා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ' ධීවර සංකීර්ණයේ ශාලාව නොමිලේ ලබා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ බස් ඩිපෝවෙහි පී. එච්. නෙලින් එල්රින් මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලයේ සාකච්ඡාවක් වෙනුවෙන් 2013-12-05 දින ප. ව. 14.00 සිට 16.00 දක්වා කාලය තුල මුදල් අය කිරීමකින් තොරව ධීවර සංකීර්ණය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013-12-05 දින ප. ව. 14.00 සිට 16.00 දක්වා කාලය තුල මුදල් අය කිරීමකින් තොරව ධීවර සංකීර්ණ ශාලාව ලබාදීට සභා අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ‘ බැංකු ගාස්තු ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා ගැනීම “ මැයෙන් පොත් තබන නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් සඳහා අයකරගෙන ඇති බැංකු ගාස්තු රු. 5008.26 ක මුදලක් වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බැංකු ගාස්තු රු. 5008.26 ක මුදලක් වියදමක් වශයෙන් ගිණුම්ගත කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ‘ ප්‍රදර්ශනය සඳහා බැනරයක් දැමීම “ මැයෙන් බලපිටිය කාර්මික විද්‍යාලයේ විදුහල්පතිතුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වසර සඳහා බලපිටිය කාර්මික විද්‍යාලයට බඳවා ගැනම පිළිබඳ ප්‍රචාරණ බැනරයක් අම්බලන්ගොඩ නගරයේ මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බලපිටිය කාර්මික විද්‍යාලයට බඳවා ගැනම පිළිබඳ ප්‍රචාරණ බැනරයක් අම්බලන්ගොඩ නගරයේ මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ‘ අත්තිකාරම් මුදල් පියවීම “ මැයෙන් වැඩ පරිපාලක ඇල්ටන් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

වාහන අලුත් වැඩියාව හා යන්ත්‍ර උපාංග ලබාගැනීම සඳහා රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබා ගත් බවත් වියදම් සඳහා රු. 24120.00 ක මුදලක් වැයවී ඇති බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:10** ‘ ක්‍රීඩා කමිටුවේදී කරන ලද ඉල්ලීම සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම ” මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ක්‍රීඩා කමිටුවේදී ගත් තීරණයක් පරිදි පාපන්දු සංචිතය සඳහා 15 පහළ දක්ෂතම ක්‍රීඩකයන් 30 දෙනෙකු තෝරා වසර පහක් පුරා පුහුණු කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **පාපන්දු සංචිතය සඳහා 15 පහළ ක්‍රීඩකයන් 30 දෙනෙකු තෝරා වසර පහක් පුරා පුහුණු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ' ලෝක ඒඩ්ස් දින සැමරුම 2013 ' මැයෙන් බලපිටිය ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකය භාර වෛද්‍ය නිලධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ලෝක ඒඩ්ස් දින සැමරුම 2013 දෙසැම්බර් 01 වන දින අම්බලන්ගොඩ නගර ශාලාවේදී සැමරීමට අදහස් කර ඇති බවත් එම ජාතික මෙහෙවර සඳහා නගර ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

ඒවගේම එදිනට පැවැත්වෙන පාගමන සඳහා ගරු මන්ත්‍රීවරුන් හට සහභාගි වන ලෙසත් ආරාධනය කර තිබුණි.

<u>තීරණය</u>

☛ **2013 දෙසැම්බර් 01 වන දින ලෝක ඒඩ්ස් දින සැමරුම වෙනුවෙන් අම්බලන්ගොඩ නගර ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ' විනෝද බද්දෙන් නිදහස්වීම සඳහා ' මැයෙන් බන්දු විජේසූරිය කලායතනයේ අධ්‍යක්ෂිකා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප කලායතනයේ සිසු සිසුවියන් සංවිධානය කරන ''කරලියේ කෝලම්'' නාට්‍ය නිර්මාණය සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවි කරනුයේ වියදම් පියවා ගැනීම සඳහා බවත් එම නිසා ඒ වෙනුවෙන් අය කරනු ලබන විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **" කරලියේ කෝලම් " නාට්‍ය නිර්මාණයේ ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් ලැබෙන ආදායම විනෝද බද්දෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ' 2013-12-31 දිනට ගබඩා, ඉන්වෙන්ට්‍රි සහ පුස්තකාල සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කිරීම ' මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරී මිය විසින් ඉදිරිපත්කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ප්‍රධාන ගබඩාව සඳහා එක් අයෙකුට අතිකාල පැය 120 බැගින් පී. කුසුම් ද සිල්වා මිය (සභාපති), අනෝමා ගාල්ලගේ මිය (සාමාජික), එම්. එච්. ගයත්‍රි නිසංසලා මිය (සාමාජික), කේ. එම්. මල්කි මිය (ගබඩා භාර නිලධාරී), කේ. ඩී. වීරසේන මයා (ගබඩා කම්කරු) යන අයද , ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා එක් අයෙකුට අතිකාල පැය 100 බැගින් සාගරිකා රුවන්මාලා මිය (සභාපති), බුද්ධිනි ප්‍රභා මිය (සාමාජික) යන අයද පුස්තකාල පොත් සඳහා එක් අයෙකුට අතිකාල පැය 100 බැගින් ඉන්ද්‍රා පටබැඳිගේ මිය (සභාපති), එච්. පී. මිහිරි කාන්ති ද සිල්වා මිය (සාමාජික) යන අයද පත් කරන බවත් ගබඩා ලැයිස්තු ලිවීම සහ ගබඩා ශේෂ සමීක්ෂණ වාර්තාවල සටහන් කිරීම සඳහා අතිකාල පැය 50 යටතේ චමිලා හර්ෂනි මිය පත් කරන බවත් ඒ සඳහා ඔවුනට ඉල්ලා ඇති පරිදි අතිකාල ලබා දීමට කටයුතු කරන ලෙසත් අධීක්ෂණය සඳහා එක් මණ්ඩලයකට ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු බැගින් නම් කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඉහත නම් සඳහන් අය සමීක්ෂණ මණ්ඩල සඳහා පත් කිරීමටත් ඉල්ලා ඇති පරිදි අතිකාල පැය ලබා දීමටත් ප්‍රධාන ගබඩාව සඳහා ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා පත් කිරීමටත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පත් කිරීමටත් පුස්තකාල පොත් සඳහා ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා පත් කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඔබතුමා තාර ගෙනවිත් ඇති බව අපට ආරංචි වුනා. ඒ ගැන අපි සතුටු වන අතර මීට වසර හතක පමණ සිට අපේ පාරවල් කීපයක වලවල් වහගන්න බැරුව ඉන්නවා. සභාපතිතුමනි අපේ ගම්වල මිනිස්සු කැමතියි ශ්‍රමදානෙන් වැඩ කරන්න. ඒ නිසා බොයිලේරුව දැනටත් තියෙන්නෙ අපේ ගමේ. තවත් තියෙන වලවල් ටික වහලම ඒ බොයිලේරුව නැවත රැගෙන ඒමට තමයි අදහස. ඒ සඳහා මා ඉල්ලීමක් කරන්නවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒවගේම මම මේ අවස්ථාවේදී අම්බලන්ගොඩ රථවාහන සැලැස්ම ඉදිරිපත් කරනවා. දැනට තියෙන ගාලු පාර පළල් කිරීම සඳහා යෝජිත සැලැස්ම ඉදිරිපත් කරල තියෙනවා.

අපේ නගරයට අවශ්‍ය පදික වේදිකාවක් තියල තියෙනවා. පාර්කින් ඒරියා එකක් තියල තියෙනවා. ඒවගේම තීරු හතරක් දීල තියෙනවා. මැද තීරුවක් දීල තියෙනවා වෙන් කරන්න. අවම හානියක් වෙන විදියට ඉතාමත් අලංකාරව ඒ වැඩේ කරල තියෙනවා.

මෙහිදී අපි ඉල්ලා සිටින්න ඕන ගාලු පාර අඩි 100 ට පළල් කරල මහාවිදිය අඩි 60 ක් වගේ ප්‍රමාණයට තබන්න කියන එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම කියන්නෙ මේ යෝජනාව අරගෙන මන්ත්‍රිවරයෙකු හරහා ඔබතුමා මහා මාර්ග පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට ඉදිරිපත් කරන්න. මම හිතනවා එතනදි තීරණයක් ගන්න පුලුවන් කියලා. එතනදි ඔබතුමාටත් අපටත් හැකියාවක් ලැබෙනව මේක නිරාකරණය කර ගන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ඒ දේ ඒ විදියට කරමු.

**තීරණය**

☛ **අම්බලන්ගොඩ නගරය සඳහා සකස් කර ඇති රථවාහන සැලැස්ම පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂම් හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු නගර සභා මන්ත්‍රීපී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි පඤ්ඤාලෝක පටුමගේ කාණුව සම්බන්ධව බලන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක වැඩ අධිකාරිට දාල තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි ලිපියක් තියෙනවා ඉහත කරුණට අදාලව තාප්පය ගරා වැටී තිබියදී එය අලුත්වැඩියා නොකලේ අධිකරණ කටයුත්තක් යෙදී තිබුණ බැවින් බවත් අධිකරණ කටයුතු අවසන් වීමෙන් පසුව ගරා වැටුන තාප්පය අලුත්වැඩියා කරන බව පිලිගන්නා බවත් අදාල නඩුවට අනුව මහජන හිංසා සිදු නොවන බවත් පොදු ජල බස්නාවක් බවත් දන්වා තිබුනි. මම මේ ලිපිය ඔබතුමාට ඉදිරිපත් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂම් හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි මේ නඩුව දිසා අධිකරණයටත් ගියා. මෙතන තිබුණ තාප්පයක් හදා ගැනීමයි කෙරෙන්නෙ සභාපතිතුමා. ඒකටත් නඩු දානව කියලා මෙහෙන් කියලා. එහෙමනම් මීට පෙර මම කියපු කියක් තියෙනවද . ඒව එකකටවත් නඩු දාල නැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රිතුමිය මෙතන තාප්පෙ බැඳීම නෙමෙයි ප්‍රශ්නෙ තියෙන්නෙ. මෙතන සද්ධාසේන මාවතේ එන වතුර පාර ඇවිල්ල මේ මහත්තයගේ ගෙදර ගාවින් නවතිනවා. එතනින් පහලට ඇවිල්ල තමයි වෙලට යන්නෙ. එතන වෙනද තිබුන විවරෙ වැහුව. ඒක තමයි උසාවියට යෑමේ නිමිත්ත වෙන්නෙ. උසාවිය තීන්දු කරා මේක මහජන පීඩාවක් වෙන්නෙ නෑ කියල. මෙයා විතරයි ඇවිල්ල තියෙන්නෙ අනිත් අය ඇවිල්ල නෑ. හැබැයි කරදරේ තියෙන කෙනා තමයි උසාවි ගියේ. අපිත් නියම කරල

තියෙනව මේ විවරෙ තියන්න කියලා වතුර බස්සන්න. මෙතන පොඩි අසාධාරණයක් තියෙනවා. සුමනසිරි මහත්මය කියන්නෙ විවරෙ තියන්නම් හැබැයි ඉස්සර තිබුණ පාර තියන්න කියලා. ඒ දවස්වල නගර සභාවෙන් කණුව හිටවල

තියෙන්නෙත් ඔය වහපු විවරය ලග තමයි. මෙතන තියෙන්නෙ පුද්ගලික ප්‍රශ්නයක්. වැස්ස දවසට යටවෙනවා. වතුර බහින්න විදියක් නැහැ. හොඳම දේ තමයි බටයක් දාල එවා පැත්තෙ කාණුවට වතුර ටික දැම්ම නම් ඉවරයි. මේක විශාල ප්‍රශ්නයක් මේ ප්‍රේමානන්ද මහත්මය හැම තැනටම ලියනවා. මේකෙ ප්‍රතිපලය වෙන්නෙ වතුර පාර ආවම තාප්පය කඩාගෙන යන එකයි. මෙතන ස්වභාවයෙන්ම වතු බහින තැනක්. මේ නඩුවම ඉවරයි අගල් හයක විවරයක් තිබ්බනම්.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම මෙතෙක් වේලා මේකට කතා නොකර හිටියෙ. මේ දෙපාර්ශවයම අපේ හිතවතුන්. 1980 දශකයේදී ඔය පාර අවහිර කිරීම තමයි මේ ප්‍රශ්නෙ මුලාරම්භය. මේ සම්බන්ධව කිප වරක්ම මේ සභාවෙ කතා කරා. යාබද නිවසේ ඉන්න පදිංචිකරුවන් ඉතාලියේ ඉන්නෙ. එතුමාත් මේකට අදාල නොවුනත් වතුර බස්සන්න කැමතියි. ඒ සියලු දේවල් කතා කරල තියෙද්දි ප්‍රශ්නය උඩ යටිකුරු වුනා  වෙනත් බලපෑම් නිසා. අවසානයේදී චෝදනාව මගේ පිට ආව.  දැනුත් මම ඒකයි පැත්තකට වෙලා හිටියෙ මේක කොයි ආකාරයෙන් විසදෙයිද කියල බලන්න. දැනුවත් වීම සඳහායි මේ කියන්නෙ. සුමනසිරි මහත්මය කියන දේත් සත්‍යක් තියෙනවා. මෙහිදී තුඩුවමුල්ල සියලු මාර්ග සංවර්ධනය කිරීමේදී මෙතන තියෙන අර්බුදකාරී තත්වයත් එක්ක ඒක කරන්න අපහසු වුනා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ ප්‍රශ්නය කාලයක් තියෙන දෙයක්. මොනදේ වුනත් සාධාරණයක් තියෙන්න ඕනෙ. සුමනසිරි මහත්මය කියන්නෙ පාර දෙනවනම් මම වතුර බහින්න දෙනවා. මෙතන ලයිට් කණුවකුත් තියෙනවනම් පාර වහන්න බැහැනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔතන සුබදාස මහත්මයලාගෙ ඕයිමේ අද්දරට වෙනකම් පාර තිබුණ. ඔතනින් යෝජනා කරල තිබුණ හේමපාල අයියලාගෙ ඉඩමෙන් අරගෙන තුඩුවමුල්ල පාරට යා කරන්න. නමුත් ඒක කෙරුනෙ නෑ. පස්සෙ ඔතන ප්‍රශ්නයක් ඇති වුණා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි ලිපියක් තියෙනවා පෝරඹ තොටුපොල පාරෙ තිලකරත්න මහත්මය ඇල පිටුපසින් මාර්ගයක් දෙන්නයි කියල. අඩි තුනක පාරක් තියෙන්නෙ. මේක බලල මොකක්හරි කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි ඔතන අර සුජීව රාළහාමිලාගෙ ගෙවල්වලට යන පාර. එතනට වෙනකන් අඩි 8 ක් විතර තියෙනවා. එතනින් එහාට අඩි තුනේ පොඩි පාර. එහා පැත්තෙන් ඇල රකෂිතයෙන් ගිහිල්ල ඒ ගෙවල් වලට යන පාර හදා ගන්න පුලුවන්. මමත් ඉල්ලා සිටිනවා සභාපතිතුමනි මේ කටයුත්ත කරන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ පිළිබඳව වාර්තාවක් වැඩ අධිකාරී මහතා ලබා දෙන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මගේ ගෙදර ඉස්සරහ තමයි සුනාමි නිවාස තියෙන්නෙ. ඒ අය අම්බලන්ගොඩ ඉදල ඇවිල්ල ඉන්නෙ කියල දිගින් දිගටම කියනවා. ළමයි 44 දෙනෙක් ඉන්නවා. පුලුවන්කමක් තියෙනව නම් එය ලබා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා.

**තීරණය**

☛ **අම්බලන්ගොඩ ගොඩහේන පාරේ ඇති රතුකුරුස නිවාස වල පදිංචි ළමයි 44 දෙනෙකුට පොත් ලබා දීම කල යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි කොබෙයිතුඩුවෙත් ඉන්නව සුනාමියෙන් ගිහිපු ළමයි ඒ අයටත් දෙන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි මේපොත් බෙදීම සිදු කරන්නෙ කොහොමද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම මෙහිදී කියන්න ඕනෙ අපේ විපක්ෂ මන්ත්‍රීවරුන් පවසා සිටිය මේ පොත් බෙදා දීමේ උත්සවයට වියදම් අඩු කරගෙන කරන්න කියල. එයට ඇහුම්කන් දීමක් වශයෙන් අපි මෙවර ගමින් ගමට ගිහින් පොත් බෙදා දෙන්න තීරණය කරා. හැබැයි අපි විලේගොඩ පොත් බෙදන්න මහ පන්සල ඉල්ලුවහම බැහැයි කියල තිබුන ජයන්ත මහත්මයගෙන් අහන්නෙ නැතුව දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

හාමුදුරුවො කියල තිබුණෙ මේක කරන්න දේශපාලනය කතා කරන්නෙ නැතිව බෙදල දෙන්නයි කියලා. හාමුදුරුවො මට කිව්ව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපිත් මේ පන්සලට යන්න පුලුවන්ද කියල බැලුවෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

එහෙම කාටවත් තහනමක් නැහැ. හැම පක්ෂයෙම අය එනව පන්සලට. වැරදි ලේබල් ගහල තියෙන්නෙ. මහ පන්සලට එන්න ඕනම කෙනෙකුට අයිතියක් තියෙනවා. අපි දායකකම් කරන නිසා මේක යුඇන්පී කියල වර්ග කරල තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

මමත් දුරුතු පෝයට උපාසක දානෙ දෙනවනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ලක්ෂ්මි මන්ත්‍රීතුමිය ඇවිල්ල 100 කට 120 කට දානෙ දෙනවා. ඕන කෙනෙකුට නිදහසේ එන්න පුලුවන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හාමුදුරුවො තමයි කියල තියෙන්නෙ ජයන්ත මහත්තයගෙන් අහල දෙන්නම් කියල.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

හාමුදුරුවො කියල තියෙන්නෙ ඇවිත් කරන්න. මොනම පක්ෂයකටවත් නැතුව කියලා. පුටු නැහැයි කියලත් කියල තියෙනව පුටු ගේන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි නිලධාරීන් යැව්වෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ඒ අය වැරදි වැටහීමක් ගත්තනම් කරන්න දෙයක් නැහැ. හාමුදුරුවො කියල තියෙන්නෙ අරහෙම. දැන් මගේ ඉස්සරහ ගෙන්නල අහන්න ඒ නිලධාරීන්ගෙන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රජා සංවර්ධන මහත්මිය, එදා මහ පන්සලට ගියහම මොකද වුනේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මම හැමදාම උදේට පන්සලේ වඩිනවා. මම උඩ ඉන්න ඇති සමහර වෙලාවට ඒ වෙලාවේ. මම වැදල බැහැල යනකොට තමයි හාමුදුරුවො කිව්වෙ මෙහෙම නගර සභාවෙන් ආවයි කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එතුමිය ඔය කිව්වෙ සැර බාල කරලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විලේගොඩ එක ධම්මයුක්තිකාරාමෙ කරමු. පනියන්දුවෙ එක ප්‍රජා ශාලාවෙ කරමු.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි මේ වෙනකොට තානායමේ පිටුපස ඇති ස්වභාවික නාන තටාකය අඩි 10 කට 12 කට වගේ සීමා වෙලා. වරායට වදින රල පහර මේ පැත්තට එනව වැලිත් අරගෙන. එතන පොඩි බැම් කැල්ලක් දාන්න ඕනෙ.

__තීරණය__

☞ **වැඩ අධිකාරීතුමා මගින් එය පරීක්ෂා කර ඉටු කිරීමට සභාව තීරණය කරන ලදී.**

__**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**__

සභාපතිතුමනි අර තාර දාන ඒව ටික කරන්න ඕනෙ.

__**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**__

ඕනෙනම් ප්‍රයිවට් දෙන්න පුලුවන්.

__**ගරු නගර සභා මන්ත්‍රී ජ්. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**__

සභාපතිතුමනි මම පොතේ දෙවනියට නම ලිව්වෙ. තාම කෙරුනෙ නැහැ.

__**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**__

සභාපතිතුමනි ඩිරෙක්ට් ලේබර්ස්ල දාල කරමු.

__තීරණය__

☞ **මාර්ග කඩතොලු වැසීම සඳහා සෘජු ශ්‍රමික පදනම යටතේ සේවකයින් යොදවා දිස්ත්‍රික් මිල ගණන් අනුව ගෙවීම් කිරීමට සභාව තීරණය කරන ලදී.**

__**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**__

සභාපතිතුමනි ස්වයංරැකියා සඳහා කඩ ලබා දීම ගැන තත්වය මොකක්ද.

__**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**__

ඒක මන්ත්‍රීවරුන් එපා කියපු නිසා මම පැත්තකින් තිබ්බ.

__**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**__

සභාපතිතුමනි ඒක නගරයට අලංකාර වන ආකාරයට කරන්න කියලයි අපි කියන්නෙ. අපේ ඡන්ද දායකයෙකුට අපි යම් සහනයක් කරන්න ඕනෙ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම කියන්නෙ කඩ ගහන්න එපා. අර බස් ස්ටෑන්ඩ් එකේ තියෙනව හිස් තැනක්. එතන ගහන්න. මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නගරයේ ජනතාවට අවහිරයක් නොවන විදියට කරන්න.

**තීරණය**

☞ **මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පසුවට කල් තබන ලදී.**

✍ **ප. ව. 1.15 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

භාරත සමරසේකර,
ලේකම් ,
අම්බලන්ගොඩ නගර සභාව.

ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 12 – 23 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**